2026



මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය

நிதி செயல் நுணுக்கக் கூற்று

FISCAL STRATEGY STATEMENT

අනුර කුමාර දිසානායක

මූදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය – 2025 ජූනි 30

அனுர குமார திசாநாயக்க

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் - 2025 ஜூன் 30

Anura Kumara Dissanayake

Minister of Finance, Planning and Economic Development – June 30, 2025



මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2026

අනුර කුමාර දිසානායක

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2025 ජුනි 30

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 සමඟින් මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය 2026 ප්‍රකාශයට පත් කරන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී

පටුන

පිටු අංකය

I කොටස – මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026

1. හැඳින්වීම **1**
2. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රමුඛතා **2**
3. මූල්‍ය ක්‍රමෝපායට සාපෙක්ෂව කාර්යසාධනය ඇගයීම **7**
4. මූල්‍ය ක්‍රමෝපාය ලඟා කර ගැනීම සඳහා සහාය වන නිශ්චිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග **11**

II කොටස – මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය 2026

1. හැඳින්වීම **15**
2. මූල්‍ය අවදානම් **15**
3. අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය පීඩනයන් **16**
4. මූල්‍ය අවදානම්වල ප්‍රධාන ප්‍රභවයන් **16**

   අ. සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවය හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම් **16**

   ආ. රජය සතු ව්‍යවසායන්ගෙන් පැන නඟින මූල්‍ය අවදානම් **21**

   ඇ. රාජ්‍ය ණය, ඇපකර සහ උපණය ලබා දීම මඟින් පැන නඟින මූල්‍ය අවදානම් **25**

   ඈ. ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම් **27**

   ඉ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම් **30**

ඇමුණුම I **32**

ඇමුණුම II **32**

I කොටස

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාවේ සිට ප්‍රතිසංස්කරණ සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම දක්වා කැපී පෙනෙන පරිවර්තනයකට ලක්ව ඇත. 2022 වසරේ දී පෙර නොවූ විරූ පරිදි ආර්ථිකය බිඳ වැටීමෙන් අනතුරුව, සාර්ව ආර්ථික ස්ථායිතාවය යථා තත්ත්වයට පත්වීම සහ විශ්වාසය නැවත ගොඩනැඟීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. 2024 වසරේ දී ආර්ථිකය සියයට 5 ක මූර්ත වර්ධනයක් වාර්තා කළ අතර එය 2014 වසරේ සිට වාර්තා කළ ඉහළම ආර්ථික වර්ධන වේගය විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, සළුල මුදල් ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙහි විනයේ ද සහාය ලබමින් අයෝජකයින් සහ ජනතාව තුළ අනාගතය පිළිබඳ විශ්වාසය නැවත ගොඩ නැඟීම සහ ආර්ථික වර්ධනය නැවත යථාවත් වීම මෙයින් පිළිඹිබු වේ.

ස්වෛරීත්ව බැඳුම්කර හුවමාරුව සම්බන්ධයෙන් වූ ඉහළ සහභාගීත්වය සහ නිල ණයහිමියන් සමඟ ගිවිසුම් ඇති කරගැනීම ආදිය හේතුවෙන් 2024 වසරේ දී ශ්‍රී ලංකාව ප්‍රධාන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස අවසන් කිරීමට ආසන්න වීම ආර්ථිකය අත් කරගත් මෙම ප්‍රගතිය සඳහා පිටිවහලක් විය. ඒ හා සමගාමීව, එළඹී ප්‍රතිපත්තින් නොවෙනස්ව අනුගමනය කිරීම පිළිඹිබු කරමින් රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සඳහා වූ කැපවීම පවත්වා ගැනීමට කටයුතු කරන ලදී. මෙලෙස රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහන සමඟ අඛණ්ඩ රැදී සිටීම, ආයෝජක විශ්වාසය සහ ෆිච් සහ මූඩි (Fitch & Moody's) ආදී ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මඟින් ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම, ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් අතර සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුල විශ්වසනීයත්වය ඉහළ නැංවීමට ඉවහල් විය.

2024 වසරේ දී පාර්ලිමේන්තුව විසින් 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය නීති ද්විත්වය බලාත්මක කරන ලදී. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි යාවත්කාලීන රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුවක් ඇතුළත් වන අතර එමඟින් රාජ්‍ය මූල්‍ය ඉලක්කයන් ස්ථාපනය කිරීම සහ ළඟා කර ගැනීම සඳහා රීති මත පදනම් වූ ප්‍රවේශයක් ප්‍රතිෂ්ඨාපනය කරයි. රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පාලනයට සහාය වන අතර එය රාජ්‍ය මූල්‍ය පාලනය නවීකරණය කරයි. එය එක් එක් අයවැය ක්‍රියාවලියට අදාළ නිශ්චිත සීමාවන් සැපයීම සඳහා රාජ්‍ය මූල්‍ය සමස්ථයන් මත නව ප්‍රමාණාත්මක ඉලක්ක සැකසීම ඇතුළුව වාර්ෂික මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක් සහ ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ.

2023 සහ 2024 වසරවල දී යථා තත්ත්වයට පත්වූ සාර්ව ආර්ථික ස්ථාවරත්වය දිගුකාලීන සමෘද්ධිය සඳහා අවශ්‍ය පදනම සපයා ඇත: උද්ධමනය සෘණ අගයක් තෙක් පහත වැටුණි; රුපියල සියයට 10 කට වඩා අගයකින් අතිප්‍රමාණය විය; සහ දළ නිල සංචිත 2025 වසරේ මැයි මාසයේ අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.3 දක්වා වර්ධනය විය. සංචාරක සහ ශ්‍රමික ප්‍රේෂණවල සාධනීය වර්ධනය හේතුවෙන් අඛණ්ඩව දෙවන වසරටත් විදේශ අංශයේ ජංගම ගිණුම අතිරික්තයක් ලෙස පැවතුණි. මෙලෙස ධනාත්මක සාධක බොහොමයක් මධ්‍යයේ වුවද, අභියෝග තවමත් එලෙසම පවතී. ගෝලීය වෙළෙඳාමේ අනපේක්ෂිත තත්ත්වයන්, විදේශ අංශයේ ඉල්ලුම අඩුවීම සහ ඉහළ දරිද්‍රතා මට්ටම් හේතුවෙන් පැන නඟින අවදානම්වලට මුහුන දීම සඳහා සැමට ප්‍රතිලාභ සලසන සංවර්ධනය, ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව ප්‍රතිසංස්කරණ මාවතේ ඊළඟ අදියරට පිවිසෙන විට, සාර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය පැහැදිළි ක්‍රියාමාර්ග රාශියක් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 මඟින් දක්වා ඇත. අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.යෙන්) සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ලඟා කර ගැනීම, රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් සියයට 15 ට වඩා ඉහළ නැංවීම, වියදම් ඉහළයාම සුපරීක්ෂාකාරීව පාලනය කිරීම සහ යටිතල පහසුකම් සහ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා ආයෝජන ඉහළ නැංවීම යන අරමුණු සමඟින් මධ්‍ය කාලීනව ණය තිරසාර මට්ටමකට ගෙන ඒම මෙම මූල්‍ය ක්‍රමෝපායෙහි ප්‍රධාන කුළුණු ලෙස දැක්විය හැක.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 වන වගන්තිය යටතේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සකස් කිරීම අනිවාර්ය කර ඇති අතර, ඒ අනුව මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂිකව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පිළියෙල කරනු ලැබිය යුතු ය.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අරමුණු

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අරමුණු පහත පරිදි වේ:

- රජයේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් වාර්ෂික අයවැය සකස් කිරීමට පෙර පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම;
- ඉදිරි වාර්ෂික අයවැය සඳහා යෝජනා සකස් කිරීමේ දී අමාත්‍යාංශවලට අවශ්‍ය උපාය මාර්ගික මඟ පෙන්වීමක් ලබා දීම;
- රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සාධාරණව, අපක්ෂපාතීව සහ කරුණු හෝ සාක්ෂි මත පදනම්ව තක්සේරු කිරීමට අවශ්‍ය පදනම ස්ථාපිත කිරීම;
- රජයේ මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව අත්කරගත් කාර්යසාධනය පිළිබඳ පාර්ලිමේන්තු අධීක්ෂණය ශක්තිමත් කිරීම; සහ
- මූල්‍ය අංශයෙහි විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ පනවන ලද රාජ්‍ය මූල්‍ය වගකීම් විධිවිධාන මඟින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ අන්තර්ගතය සම්බන්ධයෙන් නිශ්චිත වශයෙන් සපුරාලිය යුතු අවශ්‍යතා ස්ථාපිත කරනු ලබයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් නිශ්චිතව දක්වා ඇති පරිදි මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි අඩංගු විය යුතු අවම අන්තර්ගතය ඇමුණුම I හි සාරාංශගත කර ඇත.

2. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රමුඛතා

2026-2030 කාල පරාසය ඇතුලත් වන ඉදිරි පස් වසරක කාලය සඳහා වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ඉලක්ක වන්නේ සාර්ව ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වන අතරම ආදායම ඉහළ නැංවීම, වියදම් ඉහළ යාම පාලනය කිරීම සහ එමඟින් දළ මූල්‍යයන අවශ්‍යතා අවම කිරීම මඟින් රාජ්‍ය ණය තිරසාර මට්ටම තෙක් පාලනය කිරීම සහ රාජ්‍ය ණය පහත හෙළීමය. රාජ්‍ය ණය තිරසාර මට්ටමට ගෙන ඒම සඳහා දැඩි කැපවීමෙන් යුතුව ක්‍රියාකළ යුතු අතර, එය සාක්ෂාත් කර ගැනීම සඳහා වසර ගණනාවක් මුළුල්ලේ ක්‍රියාත්මක කරනු ලබන ස්ථාවර හා දිගුකාලීන ප්‍රයත්නයන් අවශ්‍ය වනු ඇත.

2023 වසරේ සිට 2027 වසර දක්වා වූ මූදල් වර්ෂ ආවරණය වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ රජය විසින් ක්‍රියාත්මක කරන ලද රජය එළඹී එකඟතාවයන් මඟින් ද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කළමනාකරණය කරන ආකාරය කෙරෙහි බලපෑම් සිදු කරයි. මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි අඩංගු වන මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනෙන් අනතුරුව ඉදිරි වසර තුනක් එනම් 2028-2030 කාලය ආවරණය වන සේ සකස් කර ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගැනීමේ දී ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන් සමඟ ඇති කරගත් ගිවිසුම් සහ කොන්දේසි ද සැලකිල්ලට ගනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වගකිවයුතු රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අරමුණු සමඟ අනුකූල වන බව රජය මඟින් තහවුරු කිරීම අවශ්‍ය වේ :

- **රාජ්‍ය ණය** තිරසාර මට්ටමක් දක්වා ගෙන ඒම සහ එම මට්ටමේ පවත්වාගෙන යාම තහවුරු කිරීම;
- අනාගත අනපේක්ෂිත අවස්ථාවලින් ආරක්ෂා වන **රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක** නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම;
- විවක්ෂණශීලී ලෙස රාජ්‍ය **මූල්‍ය අවදානම්** කළමනාකරණය කිරීම සහ අවම කිරීම;
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ **විනය, විනිවිදභාවය සහ වගවීම** සහතික කිරීම;
- වාර්ෂිකව **මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක්** සහ පස් අවුරුදු **මධ්‍යකාලීන මූල්‍ය රාමුවක්** සැකසීම සහ ප්‍රකාශයට පත්කිරීම තුළින් **රාජ්‍ය මූල්‍ය සැලසුම්කරණය** සඳහා පවතින කාල සීමාව දීර්ඝ කිරීම; සහ
- රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය පිළිබඳ **ඵලදායී සුපරීක්ෂණයට** අවශ්‍ය පහසුකම් සැලසීම.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ එම ප්‍රකාශය යටතේ ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු රජය සිය අයවැය අරමුණු සහ වියදම් ප්‍රමුඛතා සකස් කර සන්නිවේදනය කිරීමට භාවිතා කරන ප්‍රධාන මෙවලම් ලෙස ක්‍රියා කරනු ඇත. විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි රාජ්‍ය මූල්‍ය විචල්‍ය ගණනාවකට අදාළව නිශ්චිත සහ මැනිය හැකි සැළසුම් ඇතුළත් කිරීම අවශ්‍ය වේ:

- **ණය තිරසාර මට්ටම් තෙක් පහත හෙළීමේ අරමුණ**: රජය මඟින් රාජ්‍ය ණය පහත හෙළීමට සැලසුම් කර තිරසාර මට්ටමක පවත්වා ගැනීමට අදහස් කරන කාල රාමුව නිශ්චිත වශයෙන් සඳහන් කිරීම;
- **ප්‍රාථමික ශේෂ ඉලක්කය**: ඉදිරි අයවැය වර්ෂය සඳහා සහ ඊළඟ මුදල් වර්ෂ හතර සඳහා රජයේ ඉලක්කගත ප්‍රාථමික අතිරික්ත මට්ටම (සමස්ත රාජ්‍ය ආදායමෙන් පොලී නොවන වියදම් අඩු කිරීමෙන් ලැබෙන), ණය තිරසාර මට්ටමක් දක්වා පහත හෙළීමේ අරමුණු සමඟ අනුකූල වීම; සහ
- **ප්‍රාථමික වියදම් සීමාව**: ඉදිරි වාර්ෂික අයවැය සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී රජය විසින් නිරීක්ෂණය කරනු ලබන ප්‍රාථමික වියදම්වල සමස්ත වටිනාකම (එනම්, පොලිය හැර), එහි ණය තිරසාර මට්ටමක් දක්වා පහත හෙළීමේ අරමුණු සහ ප්‍රාථමික ශේෂ ඉලක්කයට අනුකූල වේ. රාජ්‍ය මූල්‍ය

කළමනාකරණ පනතට අනුව ප්‍රාථමික වියදම් සීමාව එහි ක්‍රියාත්මක වන පළමු වසර පහ සඳහා ද.දේ.නි.යෙන් සියයට 13 නොඉක්මවිය යුතුය[1].

මූල්‍ය වගකීම් රාමුවේ අවධානය යොමුවිය යුතු ප්‍රධානතම සාධක ලෙස මෙම රාජ්‍ය මූල්‍ය විචල්‍ය ත්‍රිත්වය තෝරා ගැනීම ප්‍රවේශමෙන් සිදු කරන ලද්දකි. එමෙන්ම මෙම රාජ්‍ය මූල්‍ය විචල්‍ය ත්‍රිත්වය ද එකිනෙක හා අන්තර් සම්බන්ධිතය.

නව ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සැළකිල්ලට ගනිමින් ප්‍රාථමික වියදම් සීමාව මඟින් රජයට තම අයවැය තීරණ හරහා ඍජුවම පාලනය කළ හැකි වියදම් පිළිබඳ පිළිබිඹුවක් ලබා දේ.

ප්‍රාථමික වියදම්, ප්‍රාථමික ශේෂ ඉලක්කයට අනුකූල වන පරිදි ක්‍රමාංකනය කළ යුතු අතර, ඒ සඳහා සාර්ව ආර්ථික පරාමිතීන් සහ රාජ්‍ය ආදායම පිළිබඳව වන ඉදිරි දැක්ම සඳහා පැහැදිලි සහ විශ්වාසදායක උපකල්පන සහ පුරෝකථන සකස් කිරීම අවශ්‍ය වේ.

ප්‍රාථමික ශේෂ ඉලක්කය, රජය තම රාජ්‍ය ණය කොතරම් ඉක්මනින් අඩු කිරීමට අදහස් කරන්නේ ද යන්න සමඟ ඍජුවම සම්බන්ධ වන නමුත් රජයේ ඍජු පාලනයෙන් පිටත අනෙකුත් බාහිර සාධක සහ අනපේක්ෂිත අවස්ථාවන්ද ද ණය මට්ටම් කෙරෙහි බලපෑම් කළ හැකිය (උදා: පොලී අනුපාත, උද්ධමනය, විනිමය වලනයන්, රජයේ ඇපකර හෝ අසම්භාව්‍ය බැරකම් ගෙවීමට සිදුවීම).

ණය මට්ටම පහත හෙලීමේ අරමුණ

රාජ්‍ය ණය තිරසාර මට්ටමට අඩු කිරීම සහ එම තිරසාර මට්ටමේ පවත්වා ගැනීම රාජ්‍ය මූල්‍ය වගකීමේ ප්‍රධානතම අංගයයි. ඉහළ මට්ටමක වූ රාජ්‍ය ණය සැළකිය යුතු අවධානමක් පිළිඹිබු කරන අතර එය ආර්ථිකයේ ණය ගැනීමේ පිරිවැය ඉහළ යාම සීමිත ලෙස පවතින අයවැය සම්පත් ණය සේවාකරන පිරිවැය සඳහා යොමු කිරීම සහ අනාගත ප්‍රතිපත්ති තීරණ සීමා වීම සඳහා හේතු වේ. රාජ්‍ය ණය පාලනය කළ හැකි මට්ටමක් දක්වා ගෙන ඒමේ ප්‍රයත්නය ජාත්‍යන්තර මූල්‍ය වැඩසටහනෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා කරගෙන ඇත.


වඩාත් අඩු සහ ආරක්ෂිත මට්ටමක් කරා තිරසාර ලෙස ණය පහත හෙලීම සහ රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක යථා තත්ත්වයට පත් කිරීම සඳහා, ඉදිරි වසර 20 හෝ ඊට වැඩි කාලයක් තුළ විවක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය සැකසුම් පවත්වා ගැනීම අවශ්‍ය වනු ඇත. මෙය පැහැදිලිවම මූල්‍ය ක්‍රමෝපායේ යාවත්කාලීන වන පස් අවුරුදු කාලසීමාවෙන් ඔබ්බට යයි. එබැවින් ණය අඩු කිරීමේ අරමුණ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවන දිගුකාලීන මාර්ගෝපදේශකයක් ලෙස සැළකිය යුතුය. 2032 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි. යෙන් සියයට 95 ක මට්ටමට අඩු කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන තුළ අඩංගු ප්‍රමාණාත්මක ඉලක්කවලින් එකකි. එමෙන්ම මෙය අන්තර්කාලීන ණය ඉලක්කයක් ලෙස ද අඛණ්ඩව ක්‍රියා කරනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව, සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සමඟ, මෑතකදී ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආසන්න වශයෙන් අවසන් අදියරට ලඟා වීම හේතුවෙන් 2032 වසර වන විට ද.දේ. නි.යෙන් සියයට 95 ක් වූ රාජ්‍ය ණය ඉලක්කය සියයට 90 දක්වා අඩු කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි නවතම පුරෝකථනය වේ. එබැවින් ණය ඉලක්කය සහ පුරෝකථනය අතර මධ්‍යස්ථ ප්‍රමාණයේ ස්වාරක්ෂකයක් පවතින අතර, ඉදිරි වසරවල දී ඇතිවිය හැකි ආර්ථික හා රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගැනීමේ දී එලෙස ස්වාරක්ෂකයක් පැවතීම විවක්ෂණශීලීය. මෙම පුරෝකථන නිතිපතා යාවත්කාලීන කරනු ලබන අතර, මෙම රාජ්‍ය මූල්‍ය ඉලක්කය සපුරා ගැනීම සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි රාජ්‍ය මූල්‍ය සමස්ථයන් නැවත ගණනය කළ හැකිය.

ශ්‍රී ලංකාව තම රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නැවත යථා තත්ත්වයට පත් කිරීමට සහ අනාගතයේ දී ඇතිවිය හැකි අවදානම්, අවිනිශ්චිතතා සහ අභියෝගවලට වඩා හොඳින් සූදානම් වීමට නම් රාජ්‍ය ණය මීටත් වඩා පහළ මට්ටම්වලට අඩු කළ යුතුය. රාජ්‍ය ණය ද.දේ.නි.යෙන් සියයට 60 කට වඩා අඩු ආරක්ෂිත මට්ටම්වල පවත්වා ගැනීමට පෙර තවදුරටත් ණය පහත හෙලීම සිදු කළ යුතුය. නවතම ණය පුරෝකථනයන්ට අනුව, මෙම මට්ටම ලඟා කර ගැනීම 2040 මුල් භාගයේ දී පමණ සිදු වනු ඇත.

රාජ්‍ය ණය සඳහා වන නවතම පුරෝකථන ජාත්‍යන්තර මූල්‍ය වැඩසටහනේ අඩංගු ණය තිරසාර විශ්ලේෂණයෙන් (DSA) ලබාගෙන ඇත. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයවලින් බොහොමයක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා සාර්ථකව අවසන් වීමෙන් අනතුරුව සිදු කරන ලද්දකි. මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට නියමිත සහ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි යාවත්කාලීන කිරීම් සඳහා පදනම සකසන ණය තිරසාර විශ්ලේෂණය සිදු කිරීම සඳහා තම නිලධාරීන්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා මුදල් අමාත්‍යාංශය කටයුතු කරමින් සිටියි.

රූපසටහන 1 | රාජ්‍ය ණය ද. දේ. නි. යේ % ලෙස



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන

[1] අවසර ලත් උපරිම ප්‍රාථමික වියදම් සීමාව ඉදිරි පස් අවුරුදු කාල පරිච්ඡේදය සඳහා සමාලෝචනය කර නැවත ගණනය කළ හැකි නමුත්, ණය තිරසාර මට්ටමක් දක්වා පහත හෙලීමේ අරමුණ සහ ඒ ආශ්‍රිත ප්‍රාථමික ශේෂ ඉලක්කයට අනුකූල විය යුතුය.

රජයේ ඇපකරවල මුළු එකතුව පිළිබඳ සීමාව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ නියම කර ඇති පරිදි, ද.දේ.නි.යෙන් සියයට 15[2] සිට සියයට 7.5 දක්වා අඩු කරමින් රජයේ ඇපකර සංශෝධිත සීමාවක් ස්ථාපිත කර ඇති අතර, ඇපකර නිකුත් කිරීම කළමනාකරණය කිරීම සඳහා නව නීතිමය රාමුවක් ක්‍රියාවට නංවා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනස අනාගතයේ දී රජයට ඇපකර නිකුත් කිරීමට ඇති සම්භාවිතාව සහ ඇපකරවල බලපෑම අවම කිරීම සඳහා උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


ප්‍රාථමික ශේෂ ඉලක්කය

ප්‍රාථමික ශේෂ ඉලක්කය ණය පහත හෙළීමේ අරමුණට අනුකූලව සකස් කළ යුතු අතර එය රාජ්‍ය ණය කළමනාකරණය කළ හැකි සහ ස්ථාවර මට්ටමකට නැවත පැමිණෙන තෙක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය විනයානුකූල මාවතක තබා ගැනීමට උපකාරී වන ඵලදායී මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරනු ඇත.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව, රජය මෙම ඉලක්කය සමඟ එහි සැබෑ සහ අපේක්ෂිත අනුකූලතාවය නිරීක්ෂණය කිරීම, ඕනෑම වසරක දී එහි ප්‍රගතිය හෝ කාර්යසාධනය අවදානමට ලක් කරන තත්ත්වයන් උද්ගත වුවහොත් පාර්ලිමේන්තුවට දැනුම් දීම සහ අවශ්‍ය නම් එම තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සකස් කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, ආර්ථිකය කෙරෙහි තවදුරටත් අවදානම් එල්ල කරන තත්ත්වයන් අත්විඳින්නේ නම්, ණය අඩු කිරීමේ අරමුණ සමඟ අඛණ්ඩව අනුගත වීම සහතික කිරීම සඳහා මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සහ ප්‍රාථමික ශේෂ ඉලක්කය නැවත ක්‍රමාංකනය කිරීම සිදු කිරීම අවශ්‍ය වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහනේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ රජය 2025 වසරේ සිට 2027 වසර දක්වා ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කයක් ලඟා කර ගැනීමට එකඟ වූ අතර මෙම කාලරාමුවෙන් ඔබ්බට එනම් 2028 වසරේ සිට 2030 වසර දක්වා මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අදාළ කාලපරිච්ඡේදයේ ඉතිරි වසර තුන ආවරණය කිරීම සඳහා ද මෙම ඉලක්කය සඳහා ද අවම වශයෙන් පවත්වා ගැනීමට නියමිතය. නවතම ණය තිරසාර විශ්ලේෂණය මත පදනම්ව, 2026-2030 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අදාළ කාලපරිච්ඡේදය තුළ අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ඉලක්කගත කිරීම, 2032 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි.යෙන් සියයට 95 ට වඩා පහළ මට්ටමකට ලඟා වීම සමඟ අනුකූල වේ.

රූපසටහන 2 | ප්‍රාථමික ශේෂය (ද. දේ. නි. යේ %)



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


ප්‍රාථමික වියදම් සීමාව

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ ප්‍රාථමික ශේෂ ඉලක්කයට සහ ඉදිරියේ දී අපේක්ෂිත රාජ්‍ය ආදායමට අනුකූලව, 2026 වසර සඳහා වන අයවැය සඳහා ප්‍රාථමික වියදම් සීමාව ද.දේ.නි.යෙන් සියයට 12.9 ක් ලෙස නියම කර ඇත. 2028-2030 මුදල් වර්ෂ සඳහා ප්‍රාථමික වියදමට අදාළ ඉලක්කගත සීමාව වන්නේ එය ද.දේ.නි.යෙන් සියයට 13 ක මට්ටමක පවත්වා ගැනීමයි.

2026 වසර සඳහා ද.දේ.නි.යෙන් සියයට 15.2 ක් වූ රාජ්‍ය ආදායමට අදාළ නවතම පුරෝකථනය සැලකිල්ලට ගෙන ප්‍රාථමික ශේෂ ඉලක්කය සමඟ අනුකූලතාව තහවුරු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ දක්වා ඇති මෙම ප්‍රාථමික වියදම් සීමාව සියයට 13 තුළ පවතී.

නවතම ආර්ථික තත්ත්වයන් මත සහ යාවත්කාලීන කරන ලද ඉදිරි දැක්ම මත පදනම්ව, 2026 වසරේ අයවැය සඳහා ප්‍රාථමික වියදම්වලට අදාළ නාමික සීමාව රු. බිලියන 4,470 ක් ලෙස දක්වා ඇති අතර, එය අයවැය සැබැවින්ම ක්‍රියාත්මක කිරීමේ දී අයවැය පිළියෙල කිරීමේ සහ සම්මත කිරීමේ සෑම අදියරකදීම අනුගමනය කළ යුතුය.

රූප සටහන 3 | ප්‍රාථමික වියදම



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

[2] අදාළ මුදල් වර්ෂයේ සහ ඊට පෙරාතුව වූ මුදල් වර්ෂ දෙකේ ද.දේ.නි.යේ සාමාන්‍යය අගය.

ප්‍රධාන සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය විචල්‍යයන් සඳහා නවතම ආර්ථික සංඛ්‍යාලේඛන සහ සංශෝධිත ඉදිරි දැක්ම පිළිබිඹු කිරීම පිණිස ඉදිරි වසර සඳහා අදාළ වන ප්‍රාථමික වියදම් සීමාව, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අදාළ සෑම වාර්ෂික යාවත්කාලීන කිරීමක දීම නැවත ගණනය කරනු ලැබේ. මෙම වාර්ෂික වශයෙන් සිදු කරනු ලබන යාවත්කාලීන කිරීම මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ ඉලක්කවලට සාපේක්ෂව කාර්යසාධනය පිළිබඳ විධිමත් ඇගයීමක් මඟින් ද මෙහෙයවනු ලැබේ.

අතිරේක රාජ්‍ය මූල්‍ය ඉලක්ක

මූල්‍ය ක්‍රමෝපායෙහි සවිස්තරාත්මක බව ඉහළ නැංවීමට ඉවහල් වන සෙසු රාජ්‍ය මූල්‍ය ඉලක්ක ගණනාවක් ඇති අතර, එමඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි ප්‍රධාන අවශ්‍යතා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන යටතේ සඳහන් එකඟතා සමඟ ඇති අනුකූලතාව තහවුරු කෙරේ.

ණය ප්‍රමාණය අඩුවීම සහ ඉහළ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවයක් මඟින් ලබා ගත් ප්‍රගතිය සුරක්ෂිත කිරීම සහ පවත්වා ගැනීමට අදාළ ප්‍රධානතම අරමුණ මඟින් රජයේ කෙටි කාලීන සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අරමුණු සියල්ල සඳහා ම මඟ පෙන්වනු ලබයි. මීට අමතරව, රජය ස්ථාපිත කර ඇති අනෙකුත් නිශ්චිත ඉලක්ක පහත පරිදි වේ:

- 2026 වසර සහ ඉන් ඔබ්බට රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් සියයට 15 කට වඩා ඉහළ නැංවීම;
- රාජ්‍ය වියදම් තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා එම වියදම් තාර්කීකරණය කිරීම;
- 2027 වසර සහ ඉන් ඔබ්බට රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙන් සියයට 4 කට වඩා ක්‍රමයෙන් වැඩි කිරීම සහ එය පවත්වාගෙන යාම; සහ
- 2028 වසර සහ ඉන් ඔබ්බට අයවැය හිඟය ද.දේ.නි.යෙන් සියයට 5 ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.

මධ්‍යකාලීන මූල්‍ය රාමුව

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, ඉදිරි මුදල් වර්ෂය සහ ඊළඟ මුදල් වර්ෂ හතර සඳහා මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් රජයේ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව දක්වා ඇත. පහත වගුව 1 මඟින් 2025-2030 කාලය සඳහා අදාළ වන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව දක්වා ඇති අතර, එය 2026 වසරට අදාළ අයවැය සඳහා ප්‍රධාන පරාමිතීන් සහ 2030 දක්වා කාලය සඳහා නවතම පුරෝකතන ඉදිරිපත් කරයි.

මෙම පුරෝකතන මඟින් ගම්‍ය වන්නේ රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුවේ දක්වා ඇති විවිධ අවශ්‍යතා සපුරාලීමට හැකියාවක් පවතින බවයි. ඉදිරි වසර පහ ආවරණය වන පරිදි සෑම වසරකම මධ්‍ය කාලීන මූල්‍ය රාමුව යාවත්කාලීන කෙරේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය රාමුවට සාපේක්ෂව ලභා කරගත් කාර්යසාධනය අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට සහ සත්‍ය හෝ අපේක්ෂිත අපගමනයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය වේ.

වගුව 1 | මධ්‍යකාලීන මූල්‍ය රාමුව 2025-2030

ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස (වෙනත් ආකාරයකින් සඳහන් නොකළහොත්)

දර්ශකය	2024	2025	2025	2026	2027	2028	2029	2030
	තාවකාලික	අයවැය	සංශෝධිත ඇස්තමේන්තු	ඇස්තමේන්තු	පුරෝකථන			
මුළු ආදායම සහ ප්‍රදාන	**13.7**	**15.1**	**15.1**	**15.2**	**15.3**	**15.3**	**15.4**	**15.4**
බදු ආදායම	12.4	13.9	13.9	14.0	14.1	14.1	14.2	14.2
බදු නොවන ආදායම්	1.1	1.1	1.1	1.1	1.1	1.1	1.1	1.1
ප්‍රදාන	0.2	0.1	0.1	0.1	0.1	0.1	0.1	0.1
සමස්ථ වියදම	**20.5**	**21.8**	**21.6**	**20.8**	**20.4**	**20.0**	**19.4**	**19.2**
වර්තන වියදම	**17.9**	**17.8**	**17.9**	**17.0**	**16.3**	**15.8**	**15.3**	**14.9**
පොළී නොවන වර්තන වියදම්	8.9	8.9	9.1	9.0	8.9	8.8	8.8	8.8
පොළී වියදම	9.0	8.9	8.8	8.0	7.4	7.0	6.5	6.1
ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්	**2.6**	**4.0**	**3.7**	**3.8**	**4.0**	**4.2**	**4.2**	**4.3**
එයින් රාජ්‍ය ආයෝජන	**2.7**	**4.0**	**3.7**	**3.8**	**4.0**	**4.2**	**4.2**	**4.3**
ප්‍රාථමික ශේෂය *(පොළී ගෙවීම් හැර)*	**2.2**	**2.3**	**2.3**	**2.3**	**2.3**	**2.3**	**2.4**	**2.4**
අයවැය ශේෂය	**-6.8**	**-6.7**	**-6.5**	**-5.6**	**-5.1**	**-4.6**	**-4.0**	**-3.7**
නාමික ද. දේ. නි. (රු. බිලියන)	29,899	33,000	32,036	34,754	37,664	40,779	44,163	47,826
නාමික ද. දේ. නි. (වර්ධන වේගය)	9.0	10.4	7.1	8.5	8.4	8.3	8.3	8.3
මූර්ත ද. දේ. නි. (වර්ධන වේගය)	5.0	3.0	3.5	3.1	3.1	3.1	3.1	3.1
ද. දේ. නි. අවධමනකය (ප්‍රතිශත වෙනස)	3.8	6.7	3.6	5.3	5.1	5.0	5.0	5.0
ප්‍රාථමික වියදම (ද. දේ. නි. යේ % ලෙස)	11.5	12.8	12.8	12.9	12.9	13.0	13.0	13.0
ප්‍රාථමික වියදම (රු. බිලියන)	3,441	4,240	4,100	4,470	4,876	5,301	5,731	6,241

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


සාර්ව ආර්ථික උපකල්පන

මධ්‍ය කාලීන මූල්‍ය රාමුවෙහි රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ පුරෝකතන, අනුපාත ලෙස ප්‍රකාශ කර ඇති අතර, එය අදාළ රාජ්‍ය මූල්‍ය සමස්තය නාමික දළ දේශීය නිෂ්පාදිතය (පවතින වෙළෙඳපොළ මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදිතය) සඳහා අදාළ වන පුරෝකතනයෙන් බෙදීමෙන් ගණනය කෙරේ. නාමික දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකතනවලට අදාළ උපකල්පන වගුව 1 මඟින් ඉදිරිපත් කර ඇත. මෙයට වාර්ෂිකව සියයට 3.1 ක පුරෝකතනය කරන ලද මූර්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් සහ වාර්ෂිකව සියයට 5 ක දළ දේශීය නිෂ්පාදිත අවධමනකයේ (ආර්ථිකය තුළ උද්ධමනය පිළිබඳ ඇස්තමේන්තුවක්) උපකල්පිත වර්ධනයක් ඇතුළත් වේ.

2023, 2024 සහ 2025 වසරවලට අදාළ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සකස් කිරීමේ දී භාවිතා කර ඇති (නමුත් මින් පෙර ප්‍රකාශයට පත් නොකළ) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකථනයන් 4 වැනි රූප සටහන මඟින් නිරූපණය කරයි. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ සෑම යාවත්කාලීන කිරීමකදීම, ඒ සඳහා අදාළ යාවත්කාලීන කරන ලද සාර්ව ආර්ථික පුරෝකථන සමූහයක් ඇතුළත් වන අතර ආර්ථික විචල්‍යයන්ගේ නවතම අගය සහ එම විචල්‍යයන් පිළිබඳ ඉදිරියේ දී ගෙන ඇති උපකල්පන කොතරම් දුරට ගැලපේ ද යන්න පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කෙරේ. මෙහි දැක්වෙන පරිදි, නවතම පුරෝකතනය තුළ නාමික ද.දේ.නි.යේ අගය පෙර පැවති පුරෝකතනයන්ට වඩා මධ්‍යකාලීනව අඩු වේ. මෙය මෑත කාලීන උද්ධමන තත්ත්වයට අනුකූල වන අතර එය පසුගිය වසර කිහිපය තුළ පෙර උපකල්පනය කළ ප්‍රමාණයට වඩා අඩු අගයක් විය.

මෑත කාලීන සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය පුරෝකථනයන්හි නිරවද්‍යතාවය සහ පුරෝකථන සහ ප්‍රතිඵල අතර අපගමනයන්ට හේතු වන ප්‍රධාන සාධක සමාලෝචනය කරන පරිච්ඡේදයක් රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය තුල ඇතුළත් වේ.

රූපසටහන 4 | නාමික දළ දේශීය නිෂ්පාදිතය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වගකීමෙන් බැඳුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අරමුණු සමඟ මූල්‍ය ක්‍රමෝපායයේ අනුකූලතාව

රජයේ රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති සමඟ වගකිව යුතු රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ අරමුණු පහත සඳහන් පරිදි සමීපව බැඳී ඇත:

(අ) ණය තිරසාරභාවය: රාජ්‍ය ණය තිරසාර මට්ටමකට අඩු කිරීම සහ සමස්ථ ණය ප්‍රමාණය එම සීමාවන් තුළ පවත්වා ගැනීම රජයේ අරමුණ වේ. මෙම පරමාර්ථය දිගු කාලීන අඛණ්ඩ හා සැලකිය යුතු ණය අඩු කිරීමක් අන්තර්ගත වන රාජ්‍ය මූල්‍ය ඉලක්කවලින් පිළිබිඹු වේ. ණය මට්ටම් සක්‍රීයව කළමනාකරණය කිරීම මඟින් රජය ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායීතාවය සහතික කරන අතර අනාගත පරම්පරාව මත පැටවෙන ණය බර අවම කරනු ඇත.

(ආ) රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක: රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නිර්මාණය කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම මූල්‍ය ක්‍රමෝපායයේ තවත් ප්‍රධාන අරමුණකි. අනාගතයේ දී ඇතිවිය හැකි ආර්ථිකයට බලපෑම් කරන අනපේක්ෂිත සිදුවීම් හදිසි අනපේක්ෂිත අවස්ථාවන් ආර්ථිකයට ඇතිවන පීඩන අවම කිරීමට යම් සංචිත ප්‍රමාණයක් වෙන් කර තැබීම මෙයට ඇතුළත් වේ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තුල මෙම ස්වාරක්ෂක ගොඩනැගීම සඳහා වන විධිවිධාන ඇතුළත් වන අතර එමඟින් අහිතකර තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාවේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කර, අර්බුදවලදී පීඩනකාරී ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය අවම කරනු ඇත.

(ඇ) විනය, විනිවිදභාවය, වගවීම සහ විමර්ශනශීලී බව: රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුල විනය, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. කාර්යසාධනය අධීක්ෂණය සහ වගවීම සඳහා අතිරේක යාන්ත්‍රණ ද ඇතුළත් රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති පැහැදිලි ය. විනිවිද භාවයෙන් යුත් වාර්තාකරණ පිළිවෙත් අනුගමනය කිරීම සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ස්වාධීන විමර්ශනයට ඉඩ ප්‍රස්ථාව සලස්වාදීම මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ විශ්වාසය ඉහළ නැංවීමට රජය කටයුතු කරයි.

(ඈ) දිගුකාලීන සැලසුම්කරණය: වාර්ෂික මූල්‍ය ක්‍රමෝපායය ප්‍රකාශය සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සහ පස් අවුරුදු මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමු යාවත්කාලීන කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය සැලසුම්කරණයේ කාල සීමාව දීර්ඝ කර ඇත. මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව පැහැදිලි මූල්‍ය ක්‍රමෝපායය සහ ප්‍රමුඛතා සකස් කිරීමෙන්, රජය ස්ථාවරත්වය, පුරෝකථනය කිරීමේ හැකියාව සහ සම්පත් ඵලදායී ලෙස වෙන් කිරීම ප්‍රවර්ධනය කරයි. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයෝජනවල ගුණාත්මකභාවය තිරසාරව ඉහළ නැංවීමට විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වනු ඇත.

3. මූල්‍ය ක්‍රමෝපායයට සාපේක්ෂව කාර්යසාධනය ඇගයීම

මධ්‍ය කාලීන මූල්‍ය ක්‍රමෝපායේ ඉදිරි දැක්ම ඇගයීම

2 වන කොටසේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක මත පදනම්ව, රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණට අනුකූලව ඉලක්කගත ප්‍රාථමික අතිරික්තයන් ළඟා කර ගැනීම කෙරෙහි මූල්‍ය ක්‍රමෝපායය අවධානය යොමු කරනු ලබන අතර ආර්ථික වර්ධනය සහ ස්ථායීතාවය ප්‍රවර්ධනය කරනු ලබයි. මූල්‍ය ක්‍රමෝපාය විශේෂයෙන්ම පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කර ඇත:

- **රාජ්‍ය ණය අඩු කිරීම:** 2032 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි.යෙන් සියයට 95 ට වඩා අඩු කිරීම මූල්‍ය ක්‍රමෝපාය සමඟ අනුකූල වන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නවතම පුරෝකතනයන්ට අනුව, රාජ්‍ය ණය 2030 වසර වන විට ද.දේ.නි.යෙන් සියයට 97 ක් සහ 2032 වසර වන විට ද.දේ.නි.යෙන් සියයට 90 ක් පමණ වනු ඇත.

- **රාජ්‍ය ආදායම් ඉලක්කය සපුරා ගැනීම:** 2024 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.7 ක් වූ රාජ්‍ය ආදායම 2025 වසර සහ ඉන් ඉදිරියට ද.දේ.නි.යෙන් සියයට 15 කට වඩා ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින්, ණය ගැනීම් මත යැපීම අඩු කරමින් මෙහෙයුම්, සේවා සහ ආයෝජනවලින් වැඩි ප්‍රමාණයක් සඳහා අරමුදල් සැපයීමට රජයට හැකිවන පරිදි මූල්‍ය ක්‍රමෝපාය මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ධාරිතාව ස්ථිරවම වැඩිදියුණු කිරීමට රජය උත්සාහ කරයි.

- **රජයේ ව්‍යදම් පාලනය කිරීම**: 2025 වසරේ දී සහ ඉන් ඉදිරියට ප්‍රාථමික ව්‍යදම් ද.දේ.නි.යෙන් සියයට 13 ක අලුතින් නීතිගත කරන ලද සීමාවට වඩා අඩු මට්ටමක තබා ගැනීමට සැලසුම් කිරීම මඟින් කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම සහ පිරිවැය පාලනය මැනවින් පෙන්නුම් කරයි. මනා ලෙස ව්‍යදම් පාලනය කිරීම රජයේ ව්‍යදම් තිරසාරව පවතින බවත් ඉහළම ප්‍රමුඛතා සමඟ අනුකූල වී ඇති බවත් තහවුරු කරයි.

- **රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීම**: ප්‍රාථමික ව්‍යදම මත සමස්ත සීමාව තුළ 2027 වසරේ සිට ඉදිරියට රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යෙන් සියයට 4 පමණ වැඩිකර පවත්වාගෙන යාම මඟින් ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා යටිතල පහසුකම් සංවර්ධනයේ සහ ආයෝජනයේ ඇති වැදගත්කම පෙන්නුම් කරයි. යටිතල පහසුකම් මත මනා ලෙස රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීම තුළින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම, ඵලදායීතාවය ඉහළ නැංවීම සහ දිගු කාලීන සමෘද්ධිමත් බව සඳහා පදනම දැමීම සිදු කරනු ලබයි.

- **ප්‍රාථමික අතිරික්තය ලඟා කර ගැනීම**: මෑත කාලීන වශයෙන් අත් කරගත් ප්‍රගතිය මත ගොඩනැඟෙමින් සහ 2025 වසරේ සිට සහ මධ්‍ය කාලීනව අවම වශයෙන් ද.දේ.නි. යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගැනීම තුළින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ලඟා කර ගැනීම සඳහා සැලසුම් කර ඇත. ප්‍රාථමික අතිරික්තය පැවතීම තුළින් රාජ්‍ය ආදායම පොළී නොවන වියදම් අභිබවා යන බව පෙන්නුම් කරන අතර එය ණය අඩු කර ගැනීම සහ රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නැවත ගොඩනැඟීම සඳහා අත්‍යාවශ්‍ය පියවරක් වේ.

- **අයවැය හිඟය පුළුල් වීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම** : 2028 වසරේ සිට ඉන් ඉදිරියට ද.දේ.නි. යෙන් සියයට 5 ට වඩා අඩු මට්ටමට අයවැය හිඟය ක්‍රමානුකූලව අඩුකිරීම මඟින් රාජ්‍ය මූල්‍ය විනය සහ පරම්පරා අතර සමානාත්මතාවය (Inter-generational equity) පවත්වා ගැනීම සඳහා රජයේ ඇති කැපවීම පෙන්නුම් කරයි. මෙම මූල්‍ය ක්‍රමෝපාය ළඟාකරගන්නේ නම්, අවදානම් වාරික (Risk Premia) සහ ණය සේවාකරණ වියදම අඛණ්ඩව අඩුවනු ඇති අතර එමඟින් අනෙකුත් ප්‍රමුඛතා ඉටුකිරීම සඳහා තවදුරටත් අවකාශය නිර්මාණය කරනු ලබයි. අයවැය හිඟය අඩු කිරීම රාජ්‍ය ණය මට්ටම ස්ථාවර කිරීමට සහ ආර්ථිකය පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය නැවත ඇති කිරීම සඳහා වන තීරණාත්මක පියවරක් වේ.

ඒ අනුව, රජයේ මූල්‍ය ක්‍රමෝපායෙහි අරමුණ වන්නේ කාර්යක්ෂම ආදායම් උත්පාදනය, මනා ව්‍යදම් කළමනාකරණය, ආයෝජන ප්‍රවර්ධනය, අයවැය හිඟය පුළුල් නොවී පවත්වා ගැනීම සහ ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ළඟාකර ගැනීමේ ඉලක්කය අතර සමතුලිතතාවයක් ඇති කිරීමයි. විවිධ රාජ්‍ය මූල්‍ය ඉලක්කයන්ට අනුගත වීම තුළින් වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් තහවුරු කිරීමට, ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට සහ රටේ දිගු කාලීන මූල්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට රජය අපේක්ෂා කරයි.

2024 වසර තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය

2024 වසරේ අයවැය තුළින් පුරෝකථනය කරන ලද ද.දේ.නි. යෙන් සියයට 0.8 ක ප්‍රාථමික අතිරික්තයට සාපේක්ෂව තත්‍ය වශයෙන් ද.දේ.නි. යෙන් සියයට 2.2 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කරගැනීමත් සමඟ 2024 වසරේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් තවදුරටත් කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය (වගුව 2). මෙමඟින් 2024 අයවැයට සාපේක්ෂව ප්‍රතිශතාංක 1.4 ක ධනාත්මක විචලනයක් සහ 2023 වසරේ වාර්තා වූ ද.දේ.නි. යෙන් සියයට 0.6 ප්‍රාථමික අතිරික්තයට වඩා ප්‍රතිශතාංක 1.6 ක වැඩි වීමක් පිළිබිඹු කරයි.

සමස්ත අයවැය හිඟය 2024 වසර සඳහා පුරෝකථනය කරන ලද ද.දේ.නි. යෙන් සියයට 7.6 ට සාපේක්ෂව තත්‍ය අගය සියයට 6.8 ක් වූ අතර එය 2023 වසරේ වාර්තා වූ ද.දේ.නි. යෙන් සියයට 8.3 අයවැය හිඟයට සාපේක්ෂව වඩාත් ප්‍රශස්ථ වර්ධනයක් වේ.

2024 වසරේ දී නාමික වශයෙන් සියයට 9.0 ක් වූ ද.දේ.නි. යේ වර්ධනය, සියයට 12.1 ක් වූ පුරෝකථනයට වඩා අඩු අගයක් වූ අතර මේ සඳහා මූලිකවම ආර්ථිකයේ සියළුම අංශ පුරා උද්ධමනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා කැපී පෙනෙන ලෙස අඩු වීම හේතු විය. 2024 වසරේ දී සියයට 5.0 ක් වූ මූර්ත ද.දේ.නි. යේ වර්ධනය, අයවැය පුරෝකථනය වූ සියයට 1.8 ට වඩා ඉහළ අගයක් වූ අතර එමඟින් නිෂ්පාදන, ඉදිකිරීම් සහ සංචාරක අංශවල අපේක්ෂිත ප්‍රමාණයට වඩා ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් පෙන්නුම් කරන ලදී.

2024 වසරේ දී සමස්ත ආදායම් හා ප්‍රදාන රු. බිලියන 4,091 ක් වූ අතර එය රු. බිලියන 4,127 ක් වූ අයවැය පුරෝකථනයට වඩා සුළු වශයෙන් අඩු වූ නමුත් එය ද.දේ.නි. යෙන් සියයට 13.7 ක් නියෝජනය කරමින් ද.දේ.නි. යෙන් සියයට 13.1 ක් වූ අයවැය පුරෝකථනයට වඩා ඉහළ අගයක් විය. ආදායම් හා ලාභ සහ විදේශ වෙළෙඳාම මත බදු සාමාන්‍යයෙන් එහි පුරෝකථනය කරන ලද අගයන්ට අනුකූල වූ අතර, භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම පුරෝකථනය කළ අගයට වඩා ඉහළ අගයක් විය.

2024 වසරේ දී රු. බිලියන 6,131 ක් වූ සමස්ත වියදම, ද.දේ.නි. යෙන් සියයට 20.7 ක් වූ පුරෝකථනයට සාපේකෂව ද.දේ.නි. යෙන් සියයට 20.5 ක තත්‍ය අගයක් පිළිබිඹු කළ අතර එය, රු. බිලියන 6,528 ක මූලික පුරෝකථනයට වඩා අඩු අගයක් විය. මෙය ප්‍රධාන වශයෙන් පවතින මුදල් ප්‍රවාහ සමඟින් ප්‍රාග්ධන ආයෝජන ක්‍රියාත්මක කිරීම කළමනාකරණය කිරීම සහ අයවැය ඇස්තමේන්තුගත අගයට වඩා අඩුවෙන් වැටුප් හා වේතන මත වර්තන වියදම දැරීම හේතුවෙන් සිදු විය. සහනාධාර හා පැවරුම් සහ පොළී සඳහා වන වියදම යන එක් එක් සංරචකය ආර්ථිකයේ කොටසක් ලෙස ද.දේ.නි. යෙන් සියයට 0.5 කින් පමණ වැඩි විය.

වගුව 2 | කාර්යසාධනය ඇඟයීම 2024

			රු. බිලියන	ද. දේ. නි. යේ % ලෙස	
දර්ශකය	2024 අයවැය*	2024 තාවකාලික	අයවැය සමඟ වෙනස	2024 අයවැය	2024 තාවකාලික
මුළු අදායම් සහ ප්‍රදාන	**4,127**	**4,091**	**(36)**	**13.1**	**13.7**
මුළු අදායම	**4,107**	**4,031**	**(76)**	**13.0**	**13.5**
බදු අදායම	**3,820**	**3,705**	**(115)**	**12.1**	**12.4**
ආදායම් බදු	1,080	1,026	(54)	3.4	3.4
භාණ්ඩ හා සේවා මත බදු	2,235	2,201	(34)	7.1	7.4
විදේශ වෙළඳාම මත බදු	505	477	(28)	1.6	1.6
බදු නොවන ආදායම	**287**	**326**	**39**	**0.9**	**1.1**
ප්‍රදාන	**20**	**60**	**40**	**0.1**	**0.2**
මුළු වියදම	**6,528**	**6,131**	**(397)**	**20.7**	**20.5**
වර්තන වියදම	**5,277**	**5,340**	**63**	**16.8**	**17.9**
පොළී නොවන වර්තන වියදම්	**2,626**	**2,650**	**24**	**8.3**	**8.9**
වැටුප් හා වේතන	1,127	1,066	(61)	3.6	3.6
භාණ්ඩ හා සේවා	341	351	10	1.1	1.2
සහනාධාර හා පැවරුම්	1,158	1,234	76	3.7	4.1
පොළි වියදම	2,651	2,690	39	8.4	9.0
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්	**1,251**	**791**	**(460)**	**4.0**	**2.6**
එයින් රාජ්‍ය ආයෝජන	1,260	817	(443)	4.0	2.7
ජංගම ගිණුමේ ශේෂය *(පොළී ගෙවීම් ඇතුලත් වේ, රාජ්‍ය ආයෝජන සහ ශුද්ධ ණය දීම හැර)*	**-1,170**	**-1,309**	**(139)**	**(3.7)**	**(4.4)**
ප්‍රාථමික ශේෂය *(පොළී ගෙවීම් හැර)*	**250**	**650**	**399**	**0.8**	**2.2**
අයවැය ශේෂය	**-2,401**	**-2,040**	**361**	**(7.6)**	**(6.8)**
නාමික ද. දේ. නි. (රු. බිලියන)	31,500	29,899	(1,601)		
නාමික ද. දේ. නි. (වර්ධන වේගය)	12.1	9.0	(3.1)		
මූර්ත ද. දේ. නි. (වර්ධන වේගය)	1.8	5.0	3.2		
ද. දේ. නි. අවධමනකය (ප්‍රතිශත වෙනස)	10.1	3.8	(6.3)		
ප්‍රාථමික වියදම (රු. බිලියන)	3,877	3,441	(436)		
ප්‍රාථමික වියදම (ද. දේ. නි. යේ % ලෙස)	12.3	11.5	(0.8)		

** රු.බිලියන 450 ක බැංකු ප්‍රාග්ධනීකරණය ඇතුළත් නොවේ.*
මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2025 මූල්‍ය වර්ෂයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

පවතින මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය ඇගයීම 2025 වසරේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා කාලය සඳහා වසරේ මේ දක්වා ලබා ගත් ඇස්තමේන්තු මත පදනම්ව සිදු කරන ලදී (වගුව 3).

2025 වසරේ දී ඉලක්කගත ප්‍රාථමික අතිරික්තය වන ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ඉලක්කය නිසි පරිදි ළඟා කර ගත හැකි බව වසර ආරම්භයේ සිට මේ දක්වා ප්‍රතිඵලවලින් පෙන්නුම් කර තිබේ. ප්‍රාථමික අතිරික්තය සඳහා සම්පූර්ණ වසර තුළ ළඟා කර ගත යුතු ඉලක්කය වූ රු. බිලියන 750 ට සාපේක්ෂව 2025 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 533 ක් ළඟා කර ගෙන ඇත.

2025 වසරේ පළමු මාස හතර තුළ, අයවැය මඟින් උපකල්පනය කරන ලද අනුපාතවලට අනුකූලව සියලුම ශීර්ෂයන්වල බදු ආදායම පුළුල් ලෙස වර්ධනය වෙමින් පවතී. සමස්ත ආදායමට සාපේක්ෂව රාජ්‍ය ආදායමේ ඉතා කුඩා ප්‍රමාණයක් සඳහා දායකත්වය දක්වන බදු නොවන ආදායම සහ ප්‍රදාන යන දෙවර්ගයෙන්ම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් ආදායම වර්ධනය වුව ද, මූල්‍ය වර්ෂයේ අග භාගයේදී එය ළඟා කර ගැනීමට හැකිවනු ඇත.

අයවැය සීමාවක් සහිතව ක්‍රියාත්මක කිරීම මඟින් අප්‍රේල් දක්වා පළමු මාස හතර තුළ සමස්ත වියදම සම්පූර්ණ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 23.9 ක් වන අතර, ප්‍රාථමික වියදම සම්පූර්ණ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 21.7 ක් පමණ විය. වැටුප් හා වේතන සහ සහනාධාර හා පැවරුම් පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා ඉහළ වර්ධනයක් පිළිබිඹු කිරීම හේතුවෙන් පළමු මාස හතර තුළ පුනරාවර්තන වියදම අයවැය ඇස්තමේන්තුවට වඩා වැඩි අගයක් ගනු ලැබීය. පොලී සහ ප්‍රාග්ධන වියදම් සඳහා වන වියදම් අයවැය ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් වාර්තා වී ඇත. මෙමඟින් ධනාත්මක සංඥාවක් පිළිඹිබු කළ ද, ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් වසර අගදී වේගවත් වර්ධනයක් ඇති කරන සුපුරුදු රටාවක් අනුගමනය කරන බැවින් එහි ප්‍රතිඵලය සම්බන්ධයෙන් ප්‍රවේශම් විය යුතුය.

2025 වසරේ පළමු මාස හතර තුළ 2025 ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 29.2 ක් ළඟා කර ගැනීමත් සමඟ, 2025 වසරේ ඉතිරි මාස අට තුළ ඉහළ ආදායම් අපේක්ෂාවත් සමඟ, ද.දේ.නි.යෙන් සියයට 15.1 ක ඇස්තමේන්තුගත ආදායම් නිසි පරිදි ළඟා කර ගත හැකි බව අපේක්ෂා කළ හැකිය. 2025 වසරේ පළමු කාර්තුවේ සමස්ත ආදායම් සහ ප්‍රදාන කාර්තුමය ද.දේ.නි.යෙන් සියයට 12.9 ක් විය.

වගුව 3 | 2025 කාර්යසාධනය ඇඟයීම

රු. බිලියන

දර්ශකය	2024		2025		අයවැයගත වර්ධනය	වර්ධනය	ලඟා කර ගැනීම
	වාර්ෂික*	ජන-අප්‍රේල්	වාර්ෂික	ජන-අප්‍රේල් (අ)	%	%	(අයවැයෙහි % ලෙස)
මුළු අදායම් සහ ප්‍රදාන	**4,127**	**1,218**	**4,990**	**1,455**	**20.9**	**19.4**	**29.2**
මුළු අදායම	**4,107**	**1,216**	**4,960**	**1,453**	**20.8**	**19.5**	**29.3**
බදු අදායම	**3,820**	**1,118**	**4,590**	**1,349**	**20.2**	**20.7**	**29.4**
ආදායම් බදු	1,080	244	1,167	274	8.1	12.3	23.5
භාණ්ඩ හා සේවා මත බදු	2,235	724	2,772	881	24.0	21.6	31.8
විදේශ වෙළඳාම මත බදු	505	149	651	194	28.9	30.2	29.9
බදු නොවන ආදායම	**287**	**98**	**370**	**104**	**28.9**	**6.1**	**28.2**
ප්‍රදාන	**20**	**2**	**30**	**1**	**50.0**	**(32.6)**	**4.6**
මුළු වියදම	**6,528**	**1,579**	**7,190**	**1,716**	**10.1**	**8.7**	**23.9**
වර්තන වියදම	**5,277**	**1,419**	**5,886**	**1,603**	**11.5**	**13.0**	**27.2**
පොළී නොවන වර්තන වියදම	**2,626**	**693**	**2,936**	**809**	**11.8**	**16.7**	**27.6**
වැටුප් හා වේතන	1,127	302	1,230	361	9.2	19.7	29.4
භාණ්ඩ හා සේවා	341	100	416	102	21.9	2.6	24.6
සහනාධාර හා පැවරුම්	1,158	291	1,290	345	11.4	18.5	26.8
පොළී වියදම	**2,651**	**726**	**2,950**	**794**	**11.3**	**9.4**	**26.9**
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්	**1,251**	**160**	**1,304**	**113**	**4.3**	**(29.4)**	**8.7**
එයින් රාජ්‍ය ආයෝජන	1,260	165	1,315	115	4.4	(30.3)	8.8
ජංගම ගිණුමේ ශේෂය	**-1,170**	**-203**	**-926**	**-150**			
(පොළී ගෙවීම් ඇතුලත් වේ, රාජ්‍ය ආයෝජන සහ ශුද්ධ ණය දීම හැර)							
ප්‍රාථමික ශේෂය	**250**	**365**	**750**	**533**			
(පොළී ගෙවීම් හැර)							
අයවැය ශේෂය	**-2,401**	**-361**	**-2,200**	**-262**			
ප්‍රාථමික වියදම (රු. බිලියන)	3,877	853	4,240	922	9.4	8.1	21.7

** රු.බිලියන 450 ක බැංකු ප්‍රාග්ධනීකරණය ඇතුළත් නොවේ.*

(අ) තාවකාලික

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වසර 5 ක මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අයත් කාල සීමාව තුළ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

මෑත කාලීන රාජ්‍ය මූල්‍ය වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, ඉදිරි වසර පහ සඳහා පුරෝකතනය කරන ලද රාජ්‍ය මූල්‍ය දර්ශක ළඟා කරගත හැකි දර්ශක ලෙස සලකනු ලැබිය හැකි නමුත්, ආර්ථික වාතාවරණය තුල ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයන් සහ ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී අඛණ්ඩව සාර්ථකත්වය ළඟා කර ගැනීම මත එය රඳා පවතිනු ඇත.

2026 මූල්‍ය වර්ෂය සහ ඊළඟ මූල්‍ය වර්ෂ හතර සඳහා රාජ්‍ය මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය ළඟා කර ගැනීම, 2025 වසර සඳහා අපේක්ෂා කරන ලද ආදායම් ප්‍රතිපත්තීන් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම, මධ්‍ය කාලීනව මෙම ආදායම් වැඩිදියුණු කිරීම වර්ධනය කිරීම තවදුරටත් පවත්වා ගැනීම, බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම සහ අනෙකුත් බදු පරිපාලන පියවරයන් මත පදනම් වේ.


මෙම සැලසුම්ගත ක්‍රියාමාර්ගයන්ට අනුව කටයුතු නොකළහොත් ඒ සඳහා පුනරාවර්තන වියදම්වල වර්ධනය සක්‍රීයව පාලනය කළ යුතු අතර, එමඟින් රාජ්‍ය ආයෝජන වැඩි කිරීමට අවශ්‍ය ප්‍රධාන පහසුකම් සපයන අතර සාපේක්ෂ ප්‍රමුඛතා අඛණ්ඩව සලකා බලනු ඇත.

පෞද්ගලික ආයෝජන සඳහා විශ්වාසය තැබිය හැකි තිරසාර හා ස්ථාවර වර්ධනයක් සහ යථා තත්ත්වයට පත් වීම සඳහා සාපේක්ෂව හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් අඛණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍ය වනු ඇත. පෞද්ගලික අංශය විසින් ණය ලබා ගැනීමේ වර්ධනයක් පිළිඹිබු කිරීම මේ සම්බන්ධයෙන් ඉතා ධනාත්මක කරුණකි.

රාජ්‍ය ආදායම

මධ්‍ය කාලීන මූල්‍ය රාමුව මඟින් 2024 වසරේ ද.දේ.නි. යෙන් සියයට 13.7 සිට 2025 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 15.1 දක්වා ප්‍රදාන ද ඇතුළුව සමස්ත ආදායම තවදුරටත් ඉහළ නැංවීමටත් මෑත කාලීන සහ සැලසුම්ගත ප්‍රතිසංස්කරණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමත් සමඟින් ආදායම් එකතු කිරීම හා පරිපාලනය ශක්තිමත් වීමේ පදනම මත 2030 වසර වනවිට ප්‍රදාන ද ඇතුළුව සමස්ත ආදායම ද.දේ.නි. යෙන් සියයට 15.4 ක් දක්වා ක්‍රමානුකූලව ඉහළ නැංවීමට පුරෝකථනය කර ඇත. 2022 වසරේ

රූපසටහන 5 | මුළු ආදායම (ද. දේ. නි. යේ %)



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආර්ථික අර්බුදය සිදු වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම ද.දේ.නි. යේහි ප්‍රතිශතයක් ලෙස ලොව අවම අනුපාතයන්ගෙන් එකක් විය. මෙය යථා තත්ත්වයට ගෙන ඒමට ආදායම සහ ද.දේ.නි. ය අතර අනුපාතය නැවත යථා තත්ත්යට පත් කිරීම සඳහා සැලකිය යුතු මට්ටමේ ප්‍රතිපත්තිමය පියවර ගෙන ඇත. මෙම අනුපාතයේ ඉහළ යන ප්‍රවණතාවය බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව සහ බදු ආදායම අහිමි වීම අවම කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද නිශ්චිත ප්‍රතිසංස්කරණ මාලාවක් මඟින් පිළිබිඹු කෙරේ.

රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට කටයුතු කිරීම අභියෝගාත්මක වන නමුත් 2023 සහ 2024 වසර දෙක පුරාවට ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ අපේක්ෂාවන් ඉක්මවා ගිය සාර්ථකත්වයන්, ඉලක්ක ලඟාකරගත හැකි බවට යම් තහවුරු කිරීමක් ඇති කරයි.

රාජ්‍ය වියදම සහ ප්‍රාථමික වියදම් සීමාව

2024 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 20.5 ක් වූ සමස්ත වියදම 2030 වසරේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 19.2 දක්වා ක්‍රමයෙන් අඩුවනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය ඵලදායී වියදම් කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වන ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගෙන යාම මත පදනම් වේ.

පුනරාවර්තන වියදම් 2024 වසරේ දී වූ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 17.9 සිට 2026 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 17.0 දක්වා තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර 2030 වසර වන විට එය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.9 දක්වා අඩු වනු ඇත. සාර්ථක ලෙස ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ණය ගැනීමේ අවශ්‍යතා අඩු වීම සහ වඩාත් හිතකර තත්ත්වයන් මත පදනම්ව සකසන ලද කොන්දේසි මත පදනම්ව පොළී වියදම 2024 වසරේ දී වූ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.0 සිට 2030 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.1 දක්වා අඩු වීම මේ සඳහා හේතු විය.

යටිතල පහසුකම් සංවර්ධනය සහ දිගුකාලීන ආයෝජන කෙරෙහි රජයේ පවතින දැඩි කැපවීමට සමගාමීව, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම 2024 වසරේ දී ද.දේ.නි. යෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 සිට 2027 වසරේ දී සියයට 4.0 දක්වා ඉහළ යනු ඇතැයි සහ 2030 වන විට සියයට 4.3 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ප්‍රාථමික වියදම් (පොළී නොවන) 2024 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.5 සිට 2026 වසරේ දී සියයට 12.9 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, නව මූල්‍ය වගකීම් රාමුවේ පළමු වසර පහ තුළ නීතිගත කර ඇති සියයට 13 සීමාවට වඩා සුළු වශයෙන් අඩුවෙන් මෙම මට්ටම් පවතිනු ඇත.

ප්‍රාථමික ශේෂය

රාජ්‍ය ආදායම සහ ප්‍රාථමික වියදම සඳහා වන ඉහත පුරෝකථන මත පදනම්ව, 2025 වසරේ සිට ද.දේ.නි.යෙන් අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කය සපුරා ගෙන යනු ඇත.

කෙටිකාලීන වර්ධනය සඳහා වන ප්‍රවණතාවය, උද්ධමනය සහ ආදායම පිළිබඳ අවිනිශ්චිතතාවයට මුහුණ දීම සඳහා කුඩා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂකයක් ඇතුළත් කිරීමට රජය විසින් තීරණය කර ඇති බැවින් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ පුරෝකථනයන් ඉලක්කයට වඩා තරමක් ඉහළින් පවතී.

ප්‍රාථමික ශේෂ ඉලක්ක නිවැරදිවම සමාන වන මට්ටමට වඩා තරමක් පහළින් ප්‍රාථමික වියදම් පවත්වා ගනිමින් එනම් ආරක්ෂිත ආන්තිකයක් නිර්මාණය කිරීම සඳහා රජය දැනුවත්වම තම ප්‍රාථමික වියදම් (පොළී නොවන) එහි ප්‍රාථමික ශේෂ ඉලක්කයට ළඟා වීමට අවශ්‍ය මට්ටමට වඩා මඳක් පහළින් තබා ගනිමින් මෙය සිදු කරනු ලබයි. එනම්, ප්‍රායෝගිකව ඉලක්කය සපුරා ගැනීමට ඇති අවස්ථා පුළුල් කරමින් ඒ සඳහා වන සම්භාවිතාව වැඩි කිරීම සඳහා, සැළකිය යුතු ප්‍රාථමික ශේෂයක් ඉලක්ක කර ගැනීම සඳහා ප්‍රතිපත්තිය සකසනු ඇත. නිරීක්ෂණය කරන ප්‍රතිඵල අනුව, ඉදිරි වසරවල දී මෙම ස්වාරක්ෂකයෙහි නැවත ගණනය කිරීමක් සිදු කිරීම සුදුසු විය හැකිය.

එබැවින්, 2027 දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනට අදාළ කාලපරිච්ඡේදයේ ඉතිරි කාලය තුළ සහ 2030 දක්වා මධ්‍ය කාලීන පුරෝකථන කාලපරිච්ඡේදය තුළ ඉලක්කය සපුරා ගැනීම සඳහා අදාල පුරෝකථන පුළුල් ලෙස දක්වා ඇත. රාජ්‍ය ණය බොහෝ අඩු මට්ටමක් කරා ළඟා වන තෙක් ද.දේ.නි. යෙන් අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයන් ඉලක්ක කර ගැනීම අඛණ්ඩව පවත්වාගෙන යාමට රජය දැනට අපේක්ෂා කරයි.

අයවැය ශේෂය

2024 වසරේ දී ද.දේ.නි. යෙන් සියයට 6.8 ක් වූ සමස්ත අයවැය හිඟය 2026 වසරේ දී සියයට 5.6 දක්වා සැලකිය යුතු ලෙස අඩුවීමක් සහ 2030 වන විට සියයට 3.7 දක්වා තවදුරටත් අඩුවීම පොළී ගෙවීම්වල අපේක්ෂිත පහත වැටීම සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සිදුවනු ඇත.

මෙම පුළුල් ප්‍රවේශය රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සහ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර වර්ධනයක් සහ සංවර්ධනයක් සඳහා යොමු කිරීම අරමුණු කර ඇත.

රාජ්‍ය ණය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සඳහා වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථන අනුව 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 119.2 ක් පමණ වූ රාජ්‍ය ණය 2030 වසර වන විට ද.දේ.නි. යෙන් සියයට 94.5 ක් පමණ දක්වා අඩු වනු ඇති අතර එය 2032 වසර වන විට ද.දේ.නි. යෙන් සියයට 95 ක් වූ ආරම්භක ඉලක්කයට වඩා පහත මට්ටමක පවතිනු ඇත. ප්‍රාථමික ශේෂ ඉලක්කය සහ ප්‍රාථමික වියදම් සීමාව සමග අනුගත වීම තුළින් ප්‍රධාන බාහිර බලපෑම් නොමැති විට රාජ්‍ය ණය ඉලක්කය සපුරා ගැනීමට සහාය වනු ඇත.

4. මූල්‍ය ක්‍රමෝපාය ළඟා කර ගැනීම සඳහා සහාය වන නිශ්චිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

2022 වසරේ ඇති වූ අර්බුදයට අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීම තුළින්, රජය පහත දක්වා ඇති පරිදි සහ II වන ඇමුණුමෙහි වඩාත් විස්තරාත්මකව පැහැදිලි කර ඇති පරිදි ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා පියවර ඇතුළුව නිවැරදි කිරීමේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති බොහොමයක් ක්‍රියාවට නංවා ඇත. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ ඉහත දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක කරා ළඟා වීමට සහාය දැක්වීම පිණිසය.

පසුගිය වසර තුන තුළ, ශ්‍රී ලංකාව එහි සාර්ව ආර්ථික පසුබිමට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කරන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. මෙම පියවර ආර්ථිකය ස්ථාවර කිරීමට, රාජ්‍ය ණය කළමනාකරණය කිරීමට සහ තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වී ඇති අතර, එමඟින් පහත දක්වා ඇති පරිදි වඩාත් ධනාත්මක ප්‍රතිඵල ලබා දී ඇත.

- අඛණ්ඩව වසර දෙකක ආර්ථික සංකෝචනයකින් අනතුරුව 2024 වසරේ දී ආර්ථික වර්ධනය සියයට 5 ක ආකර්ෂණීය වර්ධනයක් දක්වා යථා තත්ත්වයට පත් විය. මෙය 2014 වසරේ සිට වාර්තා වූ ඉහළම වාර්ෂික වර්ධනයයි. මෙම ධනාත්මක ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වාගෙන යමින්, 2025 වසරේ පළමු කාර්තුවේ දී ආර්ථිකය සියයට 4.8 කින් වර්ධනය විය.

- කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන වාර්ෂික උද්ධමනය, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඓතිහාසිකව ඉහළම අගය වන සියයට 69.8 දක්වා ළඟා විය. කෙසේ වෙතත්, උද්ධමනය ස්ථාවර කිරීමට ගත් උත්සාහයන්ගේ සාර්ථකත්වය සනාථ කරමින් උද්ධමන අනුපාතය 2023 වසරේ ජූලි මාසයේ දී තනි ඉලක්කම් මට්ටමකට ළඟා වූ අතර එතැන් සිට එම මට්ටමේම පවත්වාගෙන ඇත. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය -0.5 ක් ලෙස වාර්තා කරමින් සෘණ මාර්ගයකට අවතීර්ණ වූ අතර, 2025 වසරේ මැයි මාසයේ දී එය -0.7 ක් විය.

- රාජ්‍ය මූල්‍ය විනය සහ විවක්ෂණශීලී කළමනාකරණය රාජ්‍ය මූල්‍ය අංශයේ සැලකිය යුතු දියුණුවක් ඇති කිරීමට හේතු විය. 2024 වසරේ දී රු. බිලියන 650 ක ප්‍රාථමික අතිරික්තයක් හෙවත් ද.දේ.නි. යෙන් සියයට 2.2 ක් වාර්තා වූ අතර, සමස්ත අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 6.8 දක්වා අඩු විය. රජයේ ආදායම වර්ධනය වීම මෙයට හේතු විය. 2025 වසරේ මුල් මාස හතර තුළ රු. බිලියන 532.7 ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා විය.

- 2024 වසරේ දී ප්‍රදාන ඇතුළුව රජයේ සමස්ත ආදායම රු. බිලියන 4,000 ඉක්මවිය. නාමික අගයෙහි සැළකිය යුතු වර්ධනයට සමගාමීව, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම 2023 වසරේ දී වූ සියයට 11.2 සිට 2024 වසරේ දී සියයට 13.7 දක්වා වර්ධනය විය. 2025 වසරේ පළමු කාර්තුවේ දී ප්‍රදාන ද ඇතුළත් සමස්ත ආදායම ද.දේ.නි. යෙන් සියයට 12.9 ක් විය.

- විදේශ අංශය සම්බන්ධයෙන් සැලකීමේ දී, සංචාරක ඉපැයීම්වල සීඝ්‍ර වර්ධනය, සේවක ප්‍රේෂණවල ස්ථාවර වැඩිවීම සහ විදේශ අංශයේ සමස්ථ ස්ථාවරත්වය වර්ධනය වීම හේතුවෙන් 2024 වසරේ දී ඇ.ඩො බිලියන 1.2 ක ජංගම ගිණුම් අතිරික්තයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාව ධනාත්මක ප්‍රවණතාවයක් සනිටුහන් කරන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය වශයෙන් ඓතිහාසික ඉහළම විදේශ විනිමය මිලදී ගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශවික ආයතනවල ලැබීම් හේතුවෙන් 2025 වසරේ අප්‍රේල් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.3 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

- ප්‍රධාන වශයෙන් ජංගම ගිණුම් අතිරික්තයන් සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට විදේශ මුදල් ලැබීමේ ස්ථාවර ශුද්ධ ප්‍රවාහය හේතුවෙන්, 2023 වසර අවසානයේ දී වාර්ෂිකව විනිමය අනුපාතය සියයට 12.1 ක අගයකින් අතිප්‍රමාණය වීමට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී සියයට 10.7 ක අතිප්‍රමාණය වීමක් වාර්තා කරමින් විනිමය අනුපාතය අඛණ්ඩව දෙවන වසරටත් අතිප්‍රමාණය විය.

මෙම ඉලක්ක වෙත ලඟා වීම සඳහා, ශ්‍රී ලංකා රජය විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත. බදු නිදහස් සීමාවන් අඩු කිරීම, බදු අනුපාත සංශෝධනය කිරීම සහ සංස්ථාපිත ආදායම් බදු අනුපාත ඉහළ නැංවීම වැනි බදු ප්‍රතිපත්තිවල වෙනස්කම් මේ සඳහා ඇතුළත් වේ. ඊට අමතරව, එකතු කළ අගය මත බදු අනුපාත සහ නිෂ්පාදන බදු/සුරාබදු සඳහා සිදුකරන ලද ගැලපීම් මෙම ආදායම් වර්ධනයට සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට දායක විය.

ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයන්ට සමගාමීව වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ගයන් ද මධ්‍ය කාලීනව පවත්වා ගනු ඇත. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ/ අලෙවිකරණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ව්‍යවසාය සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත පැවරුම් අඩු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් සහාය දක්වන සංවර්ධන ව්‍යාපෘතිවල විචක්ෂණශීලී ආයෝජන, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව තාර්කීකරණය කිරීම මෙයට ඇතුළත් වේ.

තවද, වියදම් සීමා කිරීමට සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය වැඩිදියුණු කිරීමට ගත් ප්‍රයත්නයන් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. රජය තම මුදල් ප්‍රවාහය සාර්ථකව කළමනාකරණය කළ අතර, අයවැය හිඟයෙන් සැලකිය යුතු කොටසක් දේශීය මූලාශ්‍රවලින් මූල්‍යයනය කරන ලදී.

II කොටස

මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය
2026

1. හැඳින්වීම

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 (5) (ඊ) වගන්තියට අනුව, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය තුළ, පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී බාධා විය හැකි මූල්‍ය අවදානම්වල ප්‍රධාන ප්‍රභවයන් නිශ්චිතව සඳහන් කළ යුතු අතර, එවැනි මූල්‍ය අවදානම්වල මූල්‍යමය බලපෑම පිළිබඳ තක්සේරුවක් ද කළ යුතුය. මෙම මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති අවශ්‍යතා අනුව ප්‍රකාශයට පත් කරන ලද එවැනි පළමු වාර්තාව වේ.

ස්වාභාවික විපත්, 2019 වසරේ සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ 2022 වසරේ දී ඇති වූ ගැඹුරු, සංකීර්ණ හා අන්තර් සම්බන්ධිත සමාජ-ආර්ථික අර්බුදය ඇතුළු මෑත වසරවල දී ඇති වූ අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනගහනය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය තත්ත්වය දැඩි ලෙස බලපෑමට ලක්විය.

සමස්තයක් වශයෙන්, අවදානම් ඉහළ මට්ටමක පවතින නමුත් එම තත්ත්වය සමනය වෙමින් පවතී. රජය විසින් ක්‍රියාත්මක කරන ලද පුළුල් ප්‍රතිපත්තිමය ප්‍රයත්නයන් සහ ශ්‍රී ලංකාවේ ණයහිමියන් සමඟ සාර්ථකව සිදුකළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා ඇතුළුව සියලුම සංවර්ධන පාර්ශවකරුවන්ගේ සහයෝගය ලැබීම මේ සඳහා හේතු විය.

රාජ්‍ය මූල්‍ය වගකීම පිළිබඳ අපගේ වර්තමාන ප්‍රවේශය පදනම් වී ඇත්තේ විනිවිදභාවය මතයි.

වසර පහක මූල්‍ය සැලසුම් කාලසීමාවක් තුළ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණය සඳහා රජය ගනු ලබන ප්‍රවේශයට මඟ පෙන්වන පැහැදිලි ඉලක්ක පිහිටුවීමට රජය කටයුතු කළ යුතුය. ඉලක්ක සැකසීමේදී, ඒවා අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රගතිය පාර්ලිමේන්තුව විසින් සුපරීක්ෂණය ලක් කළ යුතුය.

මෙයින් අදහස් කරන්නේ, අදාළ ඉලක්ක සෑම වසරකම සැබවින්ම ළඟා කර ගෙන තිබේ ද යන්න සහ අනාගතය පිළිබඳව සැළකූ විට එම ඉලක්ක තවදුරටත් ළඟා කරගත හැකි මට්ටමේ පවතිනවා ද යන්න ඇතුළුව, ප්‍රගතිය පිළිබඳව දත්ත හා කරුණු මත පදනම්ව කරුණු සැඟවීමෙන් තොරව අවංකව හා අපක්ෂපාතිව කටයුතු කිරීමයි. රජය තම රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා නොගන්නේ නම් හෝ අනපේක්ෂිත ගැටළු හෝ අවධානම් පවතින්නේ නම්, එම තත්ත්වයට මුහුණ දී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය යථාතත්ත්වයට පත් කිරීම සඳහා නිවැරදි කිරීමේ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය.

ආර්ථික හා අයවැය ස්ථාවරත්වය යළි ගොඩනැඟීම සම්බන්ධව ශ්‍රී ලංකාව මෑත වසරවල දී විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර එමඟින් ආර්ථිකය ස්ථායීකරණය වීම සඳහා සහ අනාගතය පිළිබඳ විශ්වාසයක් ගොඩගැනීම සඳහා ශක්තිමත් අඩිතාලමක් නිර්මාණය වී තිබේ. අඛණ්ඩ සුපරීක්ෂාකාරිත්වය ඉතා වැදගත් වන අතර, මෙම ප්‍රගතිය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ අවදානම් දැනට පවතින මට්ටමට වඩා පහළ මට්ටම්වලට ගෙන ඒමට හැකිවන පරිදි තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුය.

වර්තමානයේ දී දරන උත්සාහයන්ගේ ප්‍රතිලාභ, වඩාත් ස්ථාවර වර්ධනයක්, වඩාත් වැඩි වූ අවස්ථාවන්, සහ වඩා ඉහළ ප්‍රතිපත්ති නම්‍යශීලීභාවයක් සමඟින් ඉදිරි පරම්පරාවන් විසින් භුක්ති විඳිනු ඇත. වඩාත් ස්ථාවර සහ අඩු අවදානම් සහිත රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් පැවතීම, විශේෂයෙන්ම ණය තිරසාර මට්ටමකට අඩු වීම මඟින් සීමිත වූ සම්පත්, රාජ්‍ය ආයෝජන ඇතුළු අනෙකුත් ප්‍රමුඛතා සඳහා යෙදවීමට අවස්ථාව සලසනු ඇත.

මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය, නූතන මූල්‍ය පාලනයේ ඉතා වැදගත් අංගයකි. කාලයත් සමඟ අවදානම් ආවරණය පුළුල් වනු ඇති අතර විශ්ලේෂණයේ ගැඹුරුබව සහ සංකීර්ණත්වය වර්ධනය වනු ඇත. මෙම ඇගයීම් ක්‍රියාවලිය නම්‍යශීලී හා අනුවර්තනය විය හැකි විය යුතු අතර, නව තොරතුරු, ප්‍රවණතා සහ වෙනස්වන තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහා නිතිපතා යාවත්කාලීන කළ යුතුය.

2. මූල්‍ය අවදානම්

මූල්‍ය අවදානම් යනු රාජ්‍ය මූල්‍ය තත්ත්වය, පුරෝකථන සහ අපේක්ෂිත අගයන්ගෙන් වෙනස් වීමට හේතු විය හැකි සාධකයන්ය.

මූල්‍ය අවදානම් තක්සේරු කිරීමේ දී, ඒවායේ ඇස්තමේන්තුගත මට්ටම්වලින් සැලකිය යුතු ලෙස වෙනස් අනපේක්ෂිත පිරිවැයක් හෝ ආදායම් හෝ ණය උත්පාදනය කිරීමට හේතු විය හැකි අනපේක්ෂිත තත්ත්වයන් හෝ සිදුවීම්වල ස්වභාවය පිළිබඳව සලකා බැලේ.

ශ්‍රී ලංකාව පිළිබඳව සලකා බැලීමේ දී, අභ්‍යන්තර හා බාහිර ලෙස ආර්ථිකයේ ඇතිවිය හැකි අනපේක්ෂිත තත්ත්වයන්, රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ගෙන් ඇති වන අවදානම්, විදේශ විනිමය අනුපාතවල සහ පොලී අනුපාතවල අනපේක්ෂිත වෙනස්වීම් සහ ස්වාභාවික ආපදාවලින් ඇතිවන බලපෑම් යන සියල්ලම මෑත අතීතයේ දී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ අනපේක්ෂිත වෙනස්කම් ඇති කිරීමට හේතු වූ අවදානම් ප්‍රභව සඳහා උදාහරණ ලෙස දැක්විය හැක.

මෙම මූලාශ්‍රවලින් පැන නැඟී මූල්‍ය අවදානම් පිළිබඳව, මෙම ලේඛනයේ ඉදිරි කොටස්වල දී විශ්ලේෂණය කර ඇත. 2022 වසරේ මුහුණ පෑ ආර්ථික අර්බුදයෙන් මීදීම සාධනීය මට්ටමක තිබුණ ද, ශ්‍රී ලංකාව තවදුරටත් අනපේක්ෂිත තත්ත්වයන්ට ගොදුරු වීමේ අවදානමට ලක්ව පවතී. මෙවැනි අවදානම් වළක්වා ගත නොහැකි නමුත් ඒවා වඩා හොඳින් තේරුම් ගෙන වඩාත් උචිත ලෙස කළමනාකරණය කළ හැකිය.

ඉදිරියේ දී තවදුරටත් අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවනු ඇතැයි උපකල්පනය කිරීම

ඥාණාන්විත වන අතර සමස්ත අවදානම් මට්ටම අඩු වෙමින් පවතින බවට තක්සේරුකර ඇති බවට දිරි ගැන්විය යුතු ය. මූල්‍ය අවදානම් පිළිබඳ තක්සේරුව වාර්ෂිකව සිදු කර ප්‍රකාශයට පත්කිරීමෙන්, සමස්ත තත්ත්වයෙහි වෙනස්කම් තේරුම් ගැනීමටත්, ජාතියක් ලෙස වඩා ශක්තිමත් වීම සඳහා ප්‍රතිපත්තිවලින් ලැබෙන දායකත්වය මැන බැලීමටත් හැකියාව ලැබේ. මෙම ලේඛනයෙහි සිදු කරන ලද තක්සේරුවේ සාරාංශයක් පහතින් දැක්වේ.

මූල්‍ය අවදානම් පිළිබඳ තක්සේරුවේ සාරාංශය

		සිදුවීමේ සම්භාවිතාව		
		කලාතුරකින් සිදුවිය හැකි (<10%)	සිදුවිය හැකි (10–50%)	බොහෝ දුරට සිදුවිය හැකි (>50%)
රාජ්‍ය මූල්‍ය කෙරෙහි ඇති කළ හැකි බලපෑම	වැඩි (>1% ද. දේ. නි. යෙන්)			සාර්ව ආර්ථික
	මධ්‍යස්ථ (0.1–1% ද. දේ. නි. යෙන්)		රජය සතු ව්‍යවසායයන් ණය, ඇපකර සහ උප ණය දීම්	ස්වභාවික විපත්
	අඩු (<0.1% ද. දේ. නි. යෙන්)	රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව		

මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයේ අනාගතයේ දී නිකුත් කිරීමට නියමිත ප්‍රකාශයන්හි දී, මූල්‍ය අංශය, (Financial Sector) දේශගුණික විපර්යාස, පළාත් පාලනය සහ නීතිමය කටයුතුවලට අදාළව පැන නැඟිය හැකි මූල්‍ය අවදානම් සඳහා ආවරණය පුළුල් කිරීමට නියමිතය.

3. අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය පීඩනයන්

2025 වසරේ අප්‍රේල් මස ලෝක බැංකුවේ ශ්‍රී ලංකා සංවර්ධනය පිළිබඳ යාවත්කාලීන (Sri Lanka Development Update) වාර්තාවේ දත්ත මඟින් ශ්‍රී ලංකාව මුහුණ දෙන පුළුල් ආර්ථික අභියෝග ඉස්මතු කෙරේ. සාර්ව ආර්ථික දර්ශක යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළ ද, කුටුම්භ ආදායම, රැකියා නියුක්තිය සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ජීවන තත්ත්වය අර්බුදයට පෙර මට්ටමට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවතී. දිනකට පුද්ගලයෙකුට ඇ.ඩො. 3.65 ක ක්‍රය ශක්ති සාම්‍යය (Purchasing Power Parity) සීමාවෙන් මනිනු ලබන දරිද්‍රතා අනුපාතය 2024 වසරේ දී සියයට 24.5 ක් වූ අතර, එමඟින්, සමාජ අවදානම් අඛණ්ඩව පවතින බව ඉස්මතු කෙරේ.

මෙම සමාජ ආර්ථික පීඩනයන්, බලපෑමට ලක් වූ ජනතාවට සහාය වීම සඳහා වන සමාජ ආරක්ෂණ ජාල සඳහා අනාගතයේ දී රජයට දැරීමට වන වියදම් ඉහළ යාමේ සම්භාවිතාවය ඉහළ නංවයි. ඒ සමඟම, වැඩිහිටි ජනගහනය වේගයෙන් වර්ධනය වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ගෙවිය යුතු සහනාධාර ඉහළ යමින් පවතින අතර, එමඟින් මූල්‍ය පීඩනයන් තවදුරටත් උත්සන්න කෙරේ. මේ සඳහා අවධානය යොමු නොකළහොත්, විශ්‍රාමිකයා විසින් පෙර දී දායකත්වයක් නොදක්වන ලද විශ්‍රාම වැටුප් ක්‍රමය, ඉහළ යන සමාජ ආරක්ෂණ අවශ්‍යතා සහ ජනගහනයේ වෙනස්කම් යනාදියේ ඒකාබද්ධ බලපෑම මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සඳහා සැලකිය යුතු අවදානමක් ඇති කරනු ඇත.

4. මූල්‍ය අවදානම්වල ප්‍රධාන ප්‍රභවයන්

අ. සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවය හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම්

ආර්ථිකයේ තත්ත්වයන් රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තීරණය කරන ප්‍රධාන සාධකයන් වන නමුත්, ඒවා බොහෝවිට රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ පුරෝකථන සම්බන්ධව ඇති අවිනිශ්චිතතාවයේ ප්‍රධාන මූලාශ්‍රය ද වේ. ගෝලීය වෙළෙඳපොළවල, භාණ්ඩ මිල ගණන්වල සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල උච්ඡාවචනයන් ආදායම් සහ වියදම්වල සැබෑ කාර්යසාධනය, පුරෝකථනයන්ගෙන් කැපී පෙනෙන ලෙස වෙනස් වීමට බලපාන සාධකයක් විය හැක.

උදාහරණයක් ලෙස, අපේක්ෂිත මට්ටමට වඩා දුර්වල ආර්ථික ක්‍රියාකාරකම් හෝ අඩු මිල මට්ටම් හේතුවෙන් බදු ආදායම් ලැබීම් අපේක්ෂිත අගයයන්ට වඩා අඩු විය හැකි අතර, ආපදාවක් හෝ අනපේක්ෂිත සිදුවීමකින් අනතුරුව සිදුකෙරෙන හදිසි ප්‍රතිචාර හෝ සමාජ ආධාර හේතුවෙන් වියදම් ශීඝ්‍රයෙන් ඉහළ යාහැකිය.

ණය ලබා ගැනීමේ පිරිවැය (Borrowing costs) සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවයට සෘජුවම බලපාන උද්ධමනය, පොලී අනුපාත සහ විනිමය අනුපාත වැනි අනෙකුත් විචල්‍යයන් ද අස්ථාවර සහ අනපේක්ෂිත ආර්ථික බලවේගයන්ගේ බලපෑමට ලක් වේ.

ආර්ථිකයේ අනපේක්ෂිත තත්ත්වයන් දරාගත හැකි මෙන්ම වෙනස්වන තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට තරම් නම්‍යශීලි විය හැකි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා, අවිනිශ්චිතතාවය සහ පුරෝකථන දෝෂ පැවතීම යථාර්ථයක් බව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඕනෑම ආර්ථිකයක් මෙන් ශ්‍රී ලංකාවෙහි තත්ත්වයට විශේෂිත වූ අවධානම් තත්ත්වයන් සමූහයක් ඇත.

අපනයන සඳහා අයිතිම කිහිපයක් මත රඳා පැවතීම සහ සංචාරක ව්‍යාපාරය, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ සහ ඛනිජ තෙල් ආනයන මත අධික ලෙස යැපීම විදේශීය හා දේශීය වශයෙන් ශ්‍රී ලංකාව අර්බුදයන්ට ලක්වීමේ අවදානම ඉහළ නැංවීමට හේතු වේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම හේතුවෙන් ඇතැම් ස්වාභාවික විපත්වලට නිරාවරණය වීම ඉහළ යන අතර, අවසානයේ දී ගෝලීය විමෝචනයට සාපේක්ෂව ඉතා සුළු දායකත්වයක් දක්වන්නේ වුව ද අනෙකුත් රටවලට සාපේක්ෂව දේශගුණික විපර්යාසවලින් ශ්‍රී ලංකාව වඩාත් දරුනු ලෙස පීඩා විඳීමට ලක් විය හැකි ය.

2019 වසරේ සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය, දැඩි නියං සහ ගංවතුර තත්ත්වයන් සහ බලශක්ති මිල අස්ථාවරත්වය ඇතුළු මෑත කාලීනව මුහුණදුන් දරුණු අනපේක්ෂිත තත්ත්වයන් සියල්ල දේශීය ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපෑම් කර ඇත.

රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අපේක්ෂිත ප්‍රතිඵලවලට වඩා වෙනස් වීමට හේතු විය හැකි සාධක:

- අයවැයේ ඉදිරිපත් කරන ලද ප්‍රධාන සිද්ධි පුරෝකථනයන්හි දී ඉතා අඩු සම්භාවිතාවයක් ඇතැයි සලකනු ලැබූ හෝ නොසලකා හරින ලද ප්‍රධාන අහඹු සිදුවීම් හෝ 'දුර්ලභ නමුත් ආන්තික සිදුවීම්' (Tail Risks) ;
- ප්‍රතිපත්තිවල බලපෑම පිළිබඳ විනිශ්චයන් ඇතුළුව ආර්ථික පුරෝකථන සකස් කිරීමේදී අනුගමනය කරන ආකෘති සහ විනිශ්චයන්හි දෝෂ හෝ පක්ෂග්‍රාහීත්වය; සහ
- පුරෝකථනය කළ දෙයට වඩා වෙනස් ප්‍රතිඵලයක් ලබා දෙන ප්‍රතිපත්ති වෙනස්කම් (උදා: නව ව්‍යදම් වැඩසටහනක් සකස් කර ඇත්නම් හෝ නව බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොකළහොත්).

මෙම අවිනිශ්චිතතා රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කිරීම සඳහා, පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාව සඳහා වූ ප්‍රධාන ආර්ථික හා රාජ්‍ය මූල්‍ය පුරෝකථනයන්හි නිරවද්‍යතාවය මෙම කොටසේ දී පරීක්ෂාවට ලක් කෙරේ. මධ්‍යකාලීනව පුරෝකථනය කරන ලද රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කළ හැකි අවිනිශ්චිතතාවයන්හි ප්‍රධාන මූලාශ්‍ර ද එමඟින් සාකච්ඡා කෙරේ.

පුරෝකථනවල කාර්යසාධනය විශ්ලේෂණය

සාර්ව ආර්ථික පුරෝකථන


ආර්ථිකයේ ස්ථාවර කාල පරිච්ඡේදවල දී සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය පිළිබඳ පුරෝකථනයන් නිවැරදිව සිදු කළ හැකි වුව ද ආර්ථිකයේ ඇති විය හැකි සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් පුරෝකථනය කිරීම ඉතා අපහසු වේ. සත්‍ය වශයෙන්ම, 2015 වසරේ සිට 2019 වසර දක්වා කාලය තුළ, නාමික දළ දේශීය නිෂ්පාදිතයේ අයවැය ඇස්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රමාණය තරමක් අඩුවෙන් පුරෝකථනය කිරීමේ නැඹුරුතාවයක් දක්නට ලැබේ. (රූප සටහන 6).

ආහාර ද්‍රව්‍යවල මිල සැලකිය යුතු ලෙස ඉහළ යාම ඇතුළු සැපයුම් අංශයේ ඇති වූ බාධාවන්, ගෝලීය බලශක්ති මිල ගණන්, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම, පසුගිය වර්ෂ කීපය තුළ ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම හේතුවෙන් සමස්ත ඉල්ලුම මත ඇති වූ පීඩනයන් යනාදිය හේතුවෙන් 2022 වසර තුළ සිදු වූ උද්ධමනයේ තියුණු වැඩිවීම, පැහැදිලිවම පුරෝකථනය කර නොතිබුණි. මෙම අනපේක්ෂිත තත්ත්වයෙන් අනතුරුව ගත වූ වසර දෙක තුළ, උද්ධමනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා තරමක් අඩු වී ඇති අතර ඒ හේතුවෙන්, නාමික දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා යම් ප්‍රමාණයකින් අඩු වී ඇත. මධ්‍යකාලීන පුරෝකථන සඳහා පසුකාලීනව කරන ලද සංශෝධන තුළින් මෙය පිළිබිඹු වේ.

2018 වසරේ සිට ඒ වන විටත් මන්දගාමී වෙමින් පැවති ආර්ථිකය මත 2019, 2020 සහ 2022 වසරවල දී අනපේක්ෂිත තත්ත්වයන් රාශියක් ඇතිවූ අතර (පිළිවෙලින් 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 සහ ආර්ථික හා ණය අර්බුදය), ඒ හේතුවෙන් එම වර්ෂ සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය අදාළ අයවැය පුරෝකථනයන්ට වඩා බෙහෙවින් අඩු විය (රූප සටහන 7). 2022 වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වූ සංකෝචනය පෙර නොවූ විරූ සංසිද්ධියක් වූ අතර එය 2020 වසරේදී ඇති වූ කොවිඩ් -19 වසංගතයෙන් ඇති වූ බලපෑමට වඩා වැඩි විය. 2024 වසරේ දී මූර්ත ආර්ථික වර්ධනය සියයට 5 ක් වූ අතර, එය 2023 වසරේ අගභාගයේ දී අයවැය සකස් කරන විට රජය අපේක්ෂා කළ වර්ධනයේ ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වඩා වැඩි විය.


සාර්ව ආර්ථික පුරෝකථනවල කාර්යසාධනය

රූපසටහන 6 | නාමික දළ දේශීය නිෂ්පාදිතය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (පුරෝකථන), ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

රූපසටහන 7 | මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (පුරෝකථන), ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

පසුගිය දශකය තුළ නාමික දළ දේශීය නිෂ්පාදිතය සඳහා සාමාන්‍ය පුරෝකථන දෝෂය සියයට 5.5 ක් පමණ වන අතර එය සැබෑ අගයට වඩා අඩුවෙන් පුරෝකථනය කිරීමකි. මෙම දශකයේ සාමාන්‍ය පුරෝකථන දෝෂයෙන් ප්‍රතිශතාංක 2.5 ක් සඳහාම හේතු වූයේ 2022 වසරේ ඇති වූ අනපේක්ෂිත උද්ධමනයයි.

2017 වසරේ සිට ගත වූ කාලය පුරාවට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සඳහා වූ පුරෝකථන කාලයත් සමඟ බොහෝ සෙයින් උච්ඡාවචනය වී ඇති අතර, සාමාන්‍යය අගයක් ලෙස මූර්ත වර්ධනය සියයට 2.5 කින් අධිතක්සේරු කිරීමේ නැඹුරුවක් දක්නට ලැබුණි. 2019 වසරේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ් - 19 වසංගතය සහ 2022 වසරේ සිදු වූ ආර්ථික අර්බුදයේ බලපෑම් මෙම අපගමනයන් සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.

රාජ්‍ය මූල්‍ය පුරෝකථන


රාජ්‍ය ආදායම

සමස්ත ආදායම සඳහා වන පුරෝකථනයන් පිළිබඳ විශ්ලේෂණයෙන් පෙනී යන්නේ පසුගිය දශකය තුළ වැඩි කාලයක් පුරාවටම ආදායම වැඩියෙන් පුරෝකථනය කිරීමේ පැහැදිලි ප්‍රවණතාවක් පැවති බවයි (රූපසටහන 8).

ආර්ථිකයේ සමස්ත ප්‍රමාණය පුරෝකථනය කිරීමේ දී ඇති වූ දෝෂ හේතුවෙන් මෙය ප්‍රමාණයන් විශාල අගයක් නොගත්ත ද, මෙහි දී රාජ්‍ය ආදායම ආර්ථිකය සත්‍ය වශයෙන්ම නියෝජනය කළ ප්‍රමාණයට වඩා විශාල කොටසක් වනු ඇතැයි නැවත නැවතත් වැරදි ලෙස පුරෝකථනයන් කළ අතර, එවැනි අධිතක්සේරු කිරීම් මඟින් ඇතැම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකිරීම ද පිළිබිඹු විය. පසුගිය දශකය තුළ සෑම වසරකම සිදු කරන ලද ආදායම් පුරෝකථනයන්හි සාමාන්‍යය, ද.දේ.නි.යෙන් සියයට 2.2 ක අධිතක්සේරුවක් පෙන්නුම් කරන ලදී.


පසුගිය වසර කිහිපය තුළ දී මෙම නැඹුරුව නිවැරදි කර ඇති අතර, පුළුල් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2023 සහ 2024 වර්ෂ සඳහා සැබෑ ආදායම අයවැය පුරෝකථනවලට අනුකූලව හෝ ඒවා ඉක්මවා ගොස් ඇත. දශකයකට අධික කාලයකට පසුව සමස්ත ආදායම නැවතත් ඉහළම මට්ටමට ළඟා වී ඇති අතර, වසර 3 ක සාමාන්‍ය පුරෝකථන දෝෂය ද.දේ.නි.යෙන් සියයට 1.1 දක්වා අඩු වී ඇත.

රූපසටහන 8 | සමස්ත අදායම සහ ප්‍රදාන



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රූපසටහන 9 | සමස්ත වියදම



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රූපසටහන 10 | ප්‍රාථමික වියදම



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය වියදම


සමස්ත වියදම සඳහා සිදු කළ පුරෝකථන බොහෝදුරට ස්ථාවර විය. සාමාන්‍යයෙන් වියදම්, පුරෝකථනය කරන ලද අගයන්ට සමාන හෝ අඩු අගයක් ගත් අතර, පොලී ගෙවීම්වලට අදාළව විචල්‍යතාවයන් පැවතුණි. අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ ආදායම්, සහ ප්‍රදාන හා මූල්‍යකරණ ප්‍රභවවල පවතින අවිනිශ්චිතතාවය සැලකිල්ලට ගනිමින්, අයවැය ඉලක්කවලට ආසන්නයෙන් පවත්වාගෙන යාමට හැකියාව ලැබෙන පරිදි, වසර තුළ අයවැය ක්‍රියාත්මක කිරීම කළමනාකරණය කර ඇත. එවැනි අවස්ථාවන්හි දී, වියදම් ගැලපීම සඳහා කපා හරින ලද වියදම්වලින් වැඩි කොටසක් ප්‍රාග්ධන වියදම් මත යෙදේ.

සංයුතියෙහි වෙනසක් පැවතිය ද, 2021 වසරේ සිට ප්‍රාථමික වියදම් අදාළ අයවැයෙහි අපේක්ෂිත සීමාව තුළ (රූපසටහන 10) පවත්වා ගන්නා ලදී. උදාහරණයක් ලෙස 2023 සහ 2024 වසරවල ප්‍රාග්ධන ආයෝජන ක්‍රියාත්මක කිරීම පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු විය.

අයවැය ශේෂය සහ ප්‍රාථමික ශේෂය


සමස්ත අයවැය ශේෂය සඳහා වන පුරෝකථනයන්, ඉහත සාකච්ඡා කරන ලද සාධකවල සමස්ත බලපෑම් නියෝජනය කරන අතර, පසුගිය දශකයේ බොහෝ අවස්ථාවල දී මේ සඳහා පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා පහළ අගයන් ලැබුණි (රූපසටහන 11). සාමාන්‍යයෙන්, පසුගිය වසර 10 තුළ අයවැය ශේෂය පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා ද.දේ.නි.යෙන් සියයට 1 කට වඩා පහළ අගයක් වූ අතර, 2019 සිට 2022 වසර දක්වා කාලසීමාව තුළ මුහුණ පෑ අනපේක්ෂිත තත්ත්වයන් අතරතුර දී, විශාලතම අපගමනයන් නිරීක්ෂණය විය. 2022 වසරේ සිට, පුරෝකථනවල කාර්යසාධනය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, සාමාන්‍යය පුරෝකථන දෝෂය ද.දේ.නි.යෙන් සියයට 0.3 ක් පමණ විය. පුරෝකථනයන්ගේ කාර්යසාධනයේ මෙම මෑත කාලීන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආදායම් පුරෝකථන සිදු කිරීමේදී මෙතෙක් කල් සිදු වූ අධිතක්සේරු කිරීමේ නැඹුරුව නිවැරදි කිරීමයි.

රූපසටහන 11 | අයවැය ශේෂය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රූපසටහන 12 | ප්‍රාථමික ශේෂය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පොලී වියදම්, විනිමය අනුපාත සහ පොලී අනුපාත යන ද්වීත්වයෙහි විචලනයන් පිළිබිඹු කරන බැවින් පුරෝකථනය කිරීම වඩාත් අපහසු වන අතර, ඒ හේතුවෙන් පොලී වියදම් බැහැර කර ප්‍රාථමික ශේෂය (රූපසටහන 12) ගණනය කරනු ලැබේ ප්‍රාථමික ශේෂය සඳහා පසුගිය වසර 10 ක සාමාන්‍යය පුරෝකථන දෝෂය ද.දේ.නි.යෙන් සියයට 0.3 ක අධිතක්සේරුවක් වේ. ඇතැම් වසරවල වූ අධිතක්සේරු කිරීම් අනෙක් වසරවල වූ අවතක්සේරු කිරීම් මඟින් තුලනය කර ඇත. 2022, 2023 සහ 2024 යන සෑම වසරකදීම ප්‍රාථමික ශේෂයේ සැබෑ අගය අදාළ අයවැය සඳහා පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා ඉහළ අගයක් ගන්නා ලදී.

සංවේදිතා සහ අවස්ථා විශ්ලේෂණය

ඉහත සාකච්ඡා තුළින් අවධාරණය කරන පරිදි, අනපේක්ෂිත ආර්ථික සංසිද්ධීන් අයවැය තත්ත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන අතර, මෙවැනි අහඹු අනපේක්ෂිත සිදුවීම්වල ස්වභාවය සහ බරපතලභාවය සම්පූර්ණයෙන් නිවැරදිව පුරෝකථනය කිරීම කිසිසේත්ම කළ නොහැකිය.

පුරෝකථනවල කාර්යසාධනය නිතිපතා ඇගයීම, සිදු කරන ලද උපකල්පනවල නිවැරදිතාව තහවුරු කිරීමටත්, ඒවා වැඩිදියුණු කිරීමටත් උපකාරී වේ. භාවිතා කරනු ලබන ආකෘතීන් වැඩිදියුණු කිරීම සහ කාර්ය මණ්ඩල හැකියාවන් ඉහළ නැංවීම, මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමේ දී තීරණාත්මක සාධකයක් වේ.

මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයේ අනාගතයේ දී නිකුත් කිරීමට නියමිත ප්‍රකාශනවල දී, ආර්ථික විචල්‍යයන්හි සිදුවන වෙනස්කම්වලට මූල්‍ය පුරෝකථන දක්වන සංවේදීතාවය පිළිබඳ අතිරේක විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට සහ ප්‍රධාන පුරෝකථනයන්ට අමතරව, ඇති විය හැකි විකල්ප අවස්ථා සඳහා පුරෝකථනයන් ඉදිරිපත් කිරීමට නියමිතය.

මධ්‍යකාලීනව ඇතිවිය හැකි අවදානම් සහ අවිනිශ්චිතතාවයන්ගේ ප්‍රභවයන්

අයවැය පුරෝකථනයන්, තරහකාරී සාධක රාශියක් පිළිබඳ විනිශ්චයන් පරාසයක් තුලනය කරනු ලබන සම්බර උපකල්පන සමූහයක් නියෝජනය කරයි. ඉදිරි

වසර පහ තුළ ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත බලපෑම් ඇති කළ හැකි ඉතා වැදගත් සාධක කිහිපයක් පහත පරිදි වේ:

- භූ දේශපාලනික අස්ථාවරත්වය - කලාප කිහිපයක් පුරා පවතින ගැටුම්වල ස්වභාවය සහ පරිමාණය පිළිබඳව පවතින අවිනිශ්චිතතාවය, සහ ගෝලීය ආර්ථික වර්ධනය, ආයෝජක විශ්වාසය, ප්‍රාග්ධන වෙළෙඳපොළ, ගෝලීය වෙළෙඳ ප්‍රවාහයන් සහ බලශක්ති මිල ගණන් කෙරෙහි එමඟින් ඇතිවන බලපෑම්.

- වෙළෙඳ ප්‍රතිපත්ති ගැටළු - ඇමරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ ප්‍රතිපත්තිය පිළිබඳව ඇති අවිනිශ්චිතභාවය සහ එය ශ්‍රී ලංකාවේ අපනයන අංශය, සහ ගෝලීය වෙළෙඳ ප්‍රවාහයන් සහ උද්ධමනය කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම්.

- ජන සංයුතියේ වෙනස්වීම් - මෑත කාලීනව දැකිය හැකි විදේශයන්ට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවයන්, සහ ශ්‍රී ලංකාවේ විවාහ සහ උපත් අනුපාත පහත වැටීම දිගටම පැවතුනහොත්, එය ආර්ථිකයේ වර්ධන වේගය අඩු කිරීමට හේතු වනු ඇත; නැතහොත්, ස්ථාවරත්වය සහ විශ්වාසය නැවත ගොඩනැගීමත් සමඟ මෙම ප්‍රවණතා නැවත යථා තත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කර ඇති බැවින් මෙය ආර්ථික වර්ධනය සඳහා ඇති අවස්ථාවක් ලෙස ද විකල්ප වශයෙන් දැක්විය හැක.

- 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් යථා තත්ත්වයට පැමිණීමේ වේගය - එය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගවත් හෝ මන්දගාමී විය හැකි අතර, නැඟී එන වෙළෙඳපොළ කෙරෙහි ඇති විශ්වාසය හෝ මූල්‍ය වෙළෙඳපොළේ තත්ත්වයන් කෙරෙහි බලපාන බාහිර සිදුවීම් මඟින් බලපෑමට ලක් විය හැකිය.

සාර්ව-මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමට ගෙන ඇති පියවර

ආර්ථිකයේ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමෙහිලා රජය සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත ඇති ප්‍රධාන අවදානම් කළමනාකරණය කිරීමට උපකාරී වන වැදගත් පියවර අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් සිටියි.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ පැහැදිලි කර ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අවධානය රාජ්‍ය ණය තිරසාර මට්ටමට අඩු කිරීම සඳහා යොමු වී ඇති අතර, එමඟින් අනපේක්ෂිත අවස්ථාවන්ට මුහුණ දීමේ දී ශ්‍රී ලංකාවට අවදානමක් ඇතිවීමේ සම්භාවිතාව අඩු කරනු ලබයි. එමඟින් අනෙකුත් කටයුතු සඳහා සම්පත් යෙදවීමට සහ අනාගතයේ දී වඩා නම්‍යශීලී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසනු ඇත.

ව්‍යාපාර ආයෝජන සහ පෞද්ගලික අංශයේ වර්ධනය සඳහා ඉවහල් වන හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට රජය උත්සාහ දරමින් සිටී. ශ්‍රී ලංකාවේ ආර්ථිකය හැකි උපරිම මට්ටමට ඉහළ නැංවීමට සහ රාජ්‍ය ආදායම ශක්තිමත්ව තබා ගැනීමට හා කාලයත් සමඟ වර්ධනය වීමට, පුළුල් පදනමකින් යුත් ආර්ථික වර්ධනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත.

මුදල් අමාත්‍යාංශය විසින්, ආර්ථික පුරෝකථනය සහ මූල්‍ය අවදානම් නිරීක්ෂණය සඳහා ම වෙන් කර ඇති සම්පත් සහ එහි තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් කරමින් සිටියි. 2021 වසරේ දී, සාර්ව-මූල්‍ය ඒකකයක් පිහිටුවන ලද අතර, එම ඒකකය සංවර්ධන පාර්ශවකරුවන්ගේ ද සහාය ඇතිව නව පුරෝකථන මෙවලම් (forecasting tools) සකසමින් සිටියි.

මූල්‍ය අවදානම් පිළිබඳ පුළුල් විශ්ලේෂණයේ තවත් අංගයක් ලෙස පුරෝකථන කාර්යසාධනය පිළිබඳ වාර්ෂික තක්සේරුවක් ඉදිරිපත් කිරීම මඟින්, නිල වශයෙන් සිදු කරනු ලබන පුරෝකථන වඩා ප්‍රවේශමෙන් හා සවිස්තරාත්මකව පරීක්ෂා කිරීමටත්, කාලයත් සමඟ ඒවායේ නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීමටත් මග පෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සාරාංශ ඇගයීම ; *බොහෝ දුරට සිදු විය හැක, වැඩි බලපෑමක් ඇතිවීමට හැකියාවක් පවතියි.*	**ශ්‍රේණිගත කිරීම**
සාර්ව ආර්ථිකයේ ඇති විය හැකි අනපේක්ෂිත තත්ත්වයන්, සාපේක්ෂව වැඩි සම්භාවිතාවකින් ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් ඇති කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිය (ඉදිරි වසර 5 තුළ සියයට 50 කට වඩා ඉහළ සම්භාවිතාවකින්). එවැනි කම්පනවල ස්වභාවය සහ බරපතලබව පුරෝකථනය කිරීම දුෂ්කර නමුත්, අතීත සිදුවීම් හා සමානව රාජ්‍ය මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් (ද.දේ.නි.යෙන් සියයට 1 කට වඩා වැඩි බලපෑමක්) ඇති කරනු ඇත. එවැනි අනපේක්ෂිත තත්ත්වයන් මඟින් ඇති විය හැකි අවදානම් නිසි පරිදි කළමනාකරණය කිරීම මඟින් එහි බලපෑම අඩු කරනු ලැබේ. අවදානම් අවම කිරීමේ උපාය මාර්ග අතරට, යම් නම්‍යශීලී බවක් සහ අතිරේක ස්වාරක්ෂකයක් නිර්මාණය කිරීම සඳහා සැලකිය යුතු ලෙස ණය මට්ටම අඩු කිරීම, සහ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ ඉලක්ක සාක්ෂාත් කිරීමට අවශ්‍ය වන පරිදි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.	

ආ. රජය සතු ව්‍යවසායයන්ගෙන් පැන නගින මූල්‍ය අවදානම්

විවිධ හේතූන් මත රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් මූල්‍ය අවදානම් මතු විය හැකිය.

රාජ්‍ය ව්‍යවසායයන් මෙහෙයුම් අවදානම්වලට මුහුණ දෙන අතර, ඒවායේ ලාභදායීතාවයට සහ ණය ආපසු ගෙවීමට ඇති හැකියාවට බලපෑම් කළ හැකි පුළුල් වෙළඳපොළ බලවේගයන්ට නිරාවරණය වේ.

ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන්වලට තම අලාභයන්ට ප්‍රමාණවත් ආපසු ගෙවීමකින් තොරව වෙළඳපොළ අසාර්ථකත්වයන්ට මුහුණ පෑමට, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හෝ රජය වෙනුවෙන් අවදානම් භාර ගැනීමට සිදුවේ. මෙය ඔවුන්ගේ වාණිජ ප්‍රතිලාභ අත් කර ගැනීමේ හැකියාවට බලපෑ හැකිය.

රජය සතු ව්‍යවසායයන් බොහෝ විට ප්‍රාග්ධන යෙදවුම් වැඩි අංශවල දිගුකාලීන ආයෝජන සිදු කරන අතර ඒ හේතුවෙන් සැලකිය යුතු මට්ටමේ ණය ප්‍රමාණයක් දැරීමට සිදු වීම හේතුවෙන් ඔවුන්ගේ ලාභ පහත වැටුණහොත් අවදානම් තත්ත්වයක් ඇති කෙරේ.

රජයේ නියාමනය සහ ප්‍රතිපත්ති තීරණ වාණිජ ආයතනවල ලාභදායීතාවයට සහ ණය ගෙවීමේ හැකියාවට සෘජුවම බලපෑ හැකිය (උදා: ඔවුන්ට අය කළ හැකි මිල ගණන් නියාමනය කරන්නේ නම්).

අවසානයේ රජය විසින්, තමන් සතු ව්‍යවසායයන් වෙතින් ලැබෙන බදු ප්‍රමාණය, ලාභාංශ සහ අනෙකුත් ආදායම් සමග රජය සතු ව්‍යවසායයන් සඳහා ලබා දෙන ඕනෑම මූල්‍ය ආධාරයක් (උදා: සහනාධාර හෝ ණය ඇපකර) පිළිබඳව තීරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන රජය සතු ව්‍යවසායයන් පිළිබඳ සමාලෝචනය

රජය සතු ව්‍යවසායයන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සැලකිය යුතු ස්ථානයක් ගෙන ඇත (රූපසටහන 13).


- ආසන්න වශයෙන් රාජ්‍ය සංස්ථා 350 ක්, වාණිජ සංස්ථා 41 ක්, රජය සතු සමාගම් 40 ක් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල 197 ක ප්‍රමාණයක් පවතී.
- රජය සතු ව්‍යවසායයන්වලට තමන්ගේම නෛතික තත්ත්වයක් (වාණිජ සංස්ථා) තිබිය හැකිය. නැතහොත් සමාගම් පනත (රජයට අයත් සමාගම්) මගින් පාලනය විය හැකිය. ඒවා සියල්ලම සම්පූර්ණයෙන්ම හෝ සම්පූර්ණයෙන්ම පාහේ රජය සතු ය.
- රජය සතු ව්‍යවසායයන් 151 ක් මූල්‍ය නොවන අංශයේ ක්‍රියාත්මක වන අතර 11ක් මූල්‍ය අංශයේ ක්‍රියාත්මක වේ.
- ව්‍යවස්ථාපිත මණ්ඩල සාමාන්‍යයෙන්, රජයේ අයවැයෙන් ලබා දෙන සෘජු අරමුදල් භාවිතා කරමින් වාණිජ නොවන කටයුතුවල නිරත වන අතර ඒවායේ මෙහෙයුම් සීමිත මූල්‍ය අවදානමක් ඇති කරයි.

ශ්‍රී ලංකාවේ රජය සතු ව්‍යවසායයන් සම්බන්ධයෙන් වූ පහත විශ්ලේෂණය මඟින් උපායමාර්ගිකව වැදගත්ම ව්‍යවසායයන් 52 (මූල්‍ය නොවන අංශයේ 41 ක් සහ මූල්‍ය අංශයේ 11 ක්) ක් පෙන්වා දී ඇත.


මෙම ආයතන ඇතුළත් උප කාණ්ඩය, උපායමාර්ගික වැදගත්කමක් ඇති ආයතන නියෝජනය කරන අතර රජයේ පුළුල්ම අධීක්ෂණයට යටත් ප්‍රමාණාත්මක මූල්‍ය අවදානමක් ඇති කිරීමට වඩාත්ම ඉඩ ඇත.

රූපසටහන 13 | රජය සතු ව්‍යවසායයන් පිලිබඳ සුවරුව


රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් 52 අංශ අනුව




රජය සතු ව්‍යවසායයන්හි සම්පූර්ණ වත්කම්වල කොටස




රජය සතු මූල්‍යමය නොවන ව්‍යවසායයන්




රජය සතු මූල්‍ය ව්‍යවසායයන්



රජය සතු මූල්‍යමය නොවන ව්‍යවසායයන් - ලාභදායීත්වය



රජය සතු මූල්‍යමය ව්‍යවසායයන් - ලාභදායීත්වය



මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මූල්‍ය කාර්යසාධනය

මෑත කාලීන ආර්ථික අර්බුදය පුරාවටම, ශ්‍රී ලංකාවේ උපායමාර්ගිකව වැදගත් රජය සතු ව්‍යවසායයන්වල මූල්‍ය ක්‍රියාකාරිත්වයට දැඩි ලෙස බලපෑම් එල්ල වූ අතර, එහි බලපෑම වඩාත් කැපී පෙනුනේ මූල්‍යමය නොවන අංශයටයි.


සමස්තයක් වශයෙන් ගත් කළ, 2020 සිට 2022 දක්වා රජය සතු මූල්‍යමය නොවන ව්‍යවසාය 41 ක් අඛණ්ඩව අලාභ වාර්තා කළ අතර, එම සමස්ත මෙහෙයුම් අලාභ ද.දේ.නි.යෙන් සියයට 3.5 ක් පමණ විය. සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගත කිරීම් මේ වන විට සිදු වී ඇති අතර, 2023 සහ 2024 වසරවල දී මෙම අංශය සමස්තයක් ලෙස ලාභදායීත්වයට නැවත පැමිණ ඇත. 2024 වසරේ දී, රජය සතු මූල්‍යමය නොවන ව්‍යාපාර 41 න් 24 ක් ලාභ වාර්තා කළ අතර 17 ක් අලාභ වාර්තා කරන ලදී. 2023 වසරේ දී අලාභ වාර්තා කරන ලද සංඛ්‍යාව 13 කි. පසුගිය වසර පහ තුළ මෙම අංශයට සැලකිය යුතු සහායක් වාර්ෂික අයවැයෙන් ලබා දී ඇත.

එම කාලය තුළම, සමස්තයක් ලෙස මූල්‍ය අංශයේ රාජ්‍ය ව්‍යවසායයන් 11 ක් (බැංකු 6 ක් සහ රක්ෂණකරුවන් 4 ක් සහ එක් අරමුදලක්) ලාභදායී විය. 2022 වසරේ ඇති වූ අර්බුදය රාජ්‍ය ව්‍යවසායයන්හි සමස්ත ලාභදායීත්වයට සැලකිය යුතු බලපෑමක් සිදු කළ නමුත් එතැන් සිට, සාපේක්ෂව බැංකු අංශයේ මනා කාර්යසාධනය හේතුවෙන් ලාභදායීත්වය ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. ආයෝජන ආදායමේ අස්ථාවරත්වය හේතුවෙන් රක්ෂණ අංශයේ තත්ත්වයන් වඩාත් අභියෝගාත්මකව පවතී. රජය සතු මූල්‍ය ආයතන රජයට සහ රාජ්‍ය ව්‍යවසාය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පාත්‍ර වීම සැලකිය යුතු මට්ටමක පවතින අතර, 2024 වසරේ දී රාජ්‍ය බැංකු දෙකකට අයවැය සහාය ලබා දී ඇත. මූල්‍ය අංශයේ රාජ්‍ය ව්‍යවසාය 11 අතුරින් එක් ආයතනයක පමණක් 2024 වසරේ දී අලාභ වාර්තා කරන ලදී.

අයවැය මත බලපෑම : රාජ්‍ය ව්‍යවසායන්


රාජ්‍ය ව්‍යවසායයන් බදු සහ ලාභාංශ ගෙවීම හරහා රජයේ අයවැයට දායක වේ. මෙහෙයුම්වලින් ලාභ උපයන, හොඳින් ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවසාය අංශයන්, කාලයත් සමඟ රජයට ශුද්ධ මූල්‍ය දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ව්‍යවසායන්හි පාඩු ලබන ක්‍රියාකාරකම් සඳහා සහනාධාර ලබා දීමට හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ගේ මූල්‍ය ශක්‍යතාව සහතික කිරීමට රජයට මූල්‍ය දායකත්වයන් ලබා දිය හැකිය.

රූපසටහන 14 | රජය සතු මූල්‍යමය නොවන ව්‍යවසායයන් මගින් රජයට ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්



මූලාශ්‍රය : රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

රූපසටහන 15 | රජය සතු මූල්‍යමය ව්‍යාපාර - රජයට ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන්



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මෑත වසරවල දී, මූල්‍යමය නොවන රජය සතු ව්‍යවසායය සඳහා සැලකිය යුතු අඛණ්ඩ අයවැය සහායක් අවශ්‍ය වී තිබුණු අතර, ඒ සඳහා රජයේ සාමාන්‍ය දායකත්වය ද.දේ.නි.යෙන් සියයට 0.4 - 0.5 ක් පමණ වේ. එය 2023 වසරේ දී, ද.දේ.නි.යෙන් සියයට 1.0 දක්වා දෙගුණ විය.

2020 සිට 2023 දක්වා කාලය තුළ මූල්‍ය අංශයේ රජය සතු ව්‍යාපාරවලට අයවැය ආධාර සුළු වශයෙන් (උදා: ඉතුරුම් සහනාධාර සහ රක්ෂණ නිෂ්පාදන සඳහා) ලැබුණු නමුත්, 2024 වසරේ දී රජය සතු ප්‍රධාන බැංකු දෙකකට සැලකිය යුතු මූල්‍ය දායකත්වයක් ලබා දෙන ලද්දේ රාජ්‍ය සහ මූල්‍යමය නොවන රජය සතු ව්‍යාපාර ණය පුළුල් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනේ කොටසක් වශයෙනි.

2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධාන රජය සතු ව්‍යාපාර ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් පසුකළ අතර, සමස්තයක් වශයෙන් ගත් කල, ඒවායේ අවදානම් අඩුවෙමින් පවතින බව පෙනේ. සමස්ත ආයතන සංඛ්‍යාව තුළ ඉහළ අවදානමක් සහිත ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් ඇති අතර, අඛණ්ඩ ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගත කිරීම් අවශ්‍ය වනු ඇත.

අනාගතයේ දී නිකුත් කිරීමට නියමිත මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයන්හි දී, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය පිරික්සන මෙවලම (Health Check Tool) භාවිතා කරමින් මූල්‍යමය නොවන අංශයේ වූ රාජ්‍ය ව්‍යවසාය 41 ක මූල්‍ය ශක්‍යතාවය සහ අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට රජය අදහස් කරයි. මෙමඟින් එක් එක් ආයතනයට අවදානම් ශ්‍රේණිගත කිරීමක් ලබාදීමට මෙන්ම රාජ්‍ය ව්‍යවසාය කළඹෙහි මූල්‍ය ස්ථායීතාවය කාලයත් සමඟ ඇගයීමට ඉඩ සැලසේ. මූල්‍යමය අංශයේ ආයතන 11 ක් දැනටමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ස්වාධීන අධීක්ෂණයට යටත් වන අතර, එමඟින් ඔවුන් මෙම විශ්ලේෂණයෙන් ආවරණය නොවන්නේ මන්දැයි පැහැදිලි වේ.

අවදානම් අවම කිරීමේ පියවර

පසුගිය වසර දෙක තුළ, රජය විසින් රාජ්‍ය ව්‍යවසායන්හි මෙහෙයුම් කාර්යසාධනය වැඩිදියුණු කිරීම සහ ඒවාට බලපෑ අවදානම් සඳහා විසඳුම් ලබා දීමට සැලකිය යුතු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අනුගමනය කර ඇත.

අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර අතරට:

- පිරිවැය-නිරූපිත මිලකරණ ප්‍රතිපත්ති
  - පිරිවැය-ආවරණය කෙරෙන මූලධර්ම මත පදනම්ව විදුලිය සහ ඉන්ධන මිල ප්‍රතිව්‍යුහගත කිරීම.
  - මිල නියම කිරීමේදී සත්‍ය වශයෙන් දරනු ලබන සේවා පිරිවැය පිළිබිඹු කරන බව සහතික වීම සඳහා හඳුන්වා දුන් ජල ගාස්තු සූත්‍රය.

- ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම
  - ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි කාලාන්තරයක් මුළුල්ලේ එකතු වූ ණය (legacy debt) රජයේ ශේෂ පත්‍රයට මාරු කිරීම.
  - රාජ්‍ය ව්‍යවසායයන් සහ අදාළ රාජ්‍ය ආයතන අතර ඇති වගකීම් නිරවුල් කිරීම.

- ආයතනික සංවර්ධනය
  - ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 ක පාලනය සහ මෙහෙයුම් ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන ඇත.

- විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ
  - 2024 අංක 36 දරන විදුලිබල පනත:
    - ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැළකිය යුතු මට්ටමේ මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වයක් ලබා දීම;
    - විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වයට ඉඩ දීම; සහ
    - කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම

  - විදුලිබල පනත සමාලෝචනය කර සංශෝධන යෝජනා කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කර ඇත.

- ඛනිජ තෙල් වෙළෙඳපොළෙහි නිදහස් වෙළෙඳපොළ තරඟකාරීත්වයට ඉඩ සැලසීම
  - 2023 වසරේ දී වෙළඳපොළ සැපයුම්කරුවන් සංඛ්‍යාව 3 ක් වූ අතර එය 2024 වසරේ දී 5 දක්වා වැඩි වීම.
  - තරඟකාරීත්වය වැඩි දියුණු කිරීමට සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.

- ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීම
  - 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සංශෝධිත ව්‍යාපාර සැලැස්ම (පෞද්ගලීකරණයකින් තොරව) අනුමත කිරීම.
  - ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පවතින විකල්ප ආකෘති රජය විසින් සෙවීම.

- ජල සැපයුම් අංශය ප්‍රතිසංස්කරණය
  - ජල ගාස්තු ප්‍රතිපත්තිය සහ ජල ගාස්තු සූත්‍රය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීම.
  - 2024 වසරේ ජූලි මාසයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආයතනික අභිප්‍රාය පිලිබඳ ප්‍රකාශය (SCI) අත්සන් කිරීම.
  - අධීක්ෂණය සඳහා, ආයතනික අභිප්‍රාය පිලිබඳ ප්‍රකාශය තුල ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) ඇතුළත් කිරීම.

- රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය
  - රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ (SOERU) ක්‍රියාකාරකම් සමස්ත ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තෙක් තාවකාලිකව අත්හිටුවීම.

සාරාංශ ඇගයීම: *සිදු විය හැකි මධ්‍යස්ථ බලපෑමක් සහිත.*	ශ්‍රේණිගත කිරීම
ලාභදායිත්වය ඉහළ නංවා ණය අවදානම් අඩු කර ඇති මෑතකාලීන ප්‍රතිපත්තිමය වෙනස්වීම් මධ්‍යයේ වුවද, ඉදිරි වසර පහ තුළ ශ්‍රී ලංකාවේ රජය සතු ව්‍යවසායයන් සඳහා අමතර අයවැය සහාය අවශ්‍ය වීමේ මධ්‍යස්ථ සම්භාවිතාවක් පවතී. මෙම අවදානම සඳහා මුහුණ දීමට සිදු වුවහොත්, අයවැය මත අපේක්ෂිත බලපෑම ද.දේ.නි. යෙන් සියයට 0.5 සිට 1.0 දක්වා පරාසයක පවතී. මෙම අවදානම් අවම කිරීම සඳහා ක්‍රමෝපායයන් අතරට නියාමන ප්‍රතිසංස්කරණ හරහා රජය සතු ව්‍යවසායයන්ගේ ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, කළමනාකරණය සහ පාලනය නවීකරණය කිරීම සහ ඉහළ අවදානම් සහිත ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළත් වේ.	

ඇ. රාජ්‍ය ණය, ඇපකර සහ උප ණය ලබා දීමෙන් පැන නගින මූල්‍ය අවදානම්

පුනරාවර්තන වියදම්හි හිඟයන් පියවීම සඳහා මුදල් සපයාගැනීම, රාජ්‍ය ආයෝජන සඳහා අරමුදල් රැස් කිරීම හෝ රජය සතු ව්‍යවසායයන්, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන විසින් ඇපකර මත ලබා ගත් ණය පියවීම සඳහා රජය විසින් ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් මූල්‍ය අවදානම් පැන නඟී. මූල්‍ය අවදානම් සිදුවීම ඇතුළුව සමස්ත ණයගැතිභාවයේ මට්ටම දිගු කාලයක් මුළුල්ලේ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සමඟ බැඳී පවතී.

ණය ගැනීම දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් සිදු කරන්නේද යන්න සහ පොලී අනුපාත ස්ථාවර හෝ විචල්‍ය ද යන්න ඇතුළුව අනෙකුත් සාධක අතරින් කල් පිරීමේ ව්‍යුහය ඇතුළුව ලබා ගන්නා ණය කළඹෙහි ව්‍යුහය පිළිබඳව රජය විසින් තීරණය කරනු ලබයි. මෙම ණය කළඹ තේරීම් සිදු කරනු ලබන්නේ ණය ගැනීමේ සමස්ත පිරිවැය සහ අවදානම් තුලනය කිරීමෙන් අනතුරුවය.

වෙනත් රජයේ ආයතන වෙනුවෙන් ණය ගැනීමේ දී හෝ ඇපකර ලබා දීමේ දී, අවශ්‍ය නම් එම ණය ආපසු ගෙවීමට හෝ සේවාකරණයට පොරොන්දු වීමෙන් රජය විසින් මෙම ආයතනවල අවදානම් කිහිපයක් ස්ථිර වශයෙන්ම උපකල්පනය කරයි.

රාජ්‍ය ණය පහළ මට්ටමකට ගෙන ඒම

2026 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ සහ වැඩසටහනට සම්බන්ධ විවිධ ලේඛනවල විස්තර කර ඇති පරිදි, ශ්‍රී ලංකාවට ඇති ඉහළ මට්ටමේ රාජ්‍ය ණය හේතුවෙන් ඇතිවන අවදානම් සහ එම අවදානම් අඩු කිරීම කෙරෙහි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රධානතම අවධානය යොමු වී ඇත. සාර්ව ආර්ථික ස්ථායීතාවය යළි ගොඩනැගීම සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ගෙන ඇති පියවර ශ්‍රී ලංකාව තිරසාර ණය මට්ටමක් වෙත නැවත ප්‍රවේශවීම සඳහා උපකාරී වනු ඇත.

නවතම පුරෝකථන තුළින් පෙනී යන්නේ 2032 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි.යෙන් සියයට 95 ට වඩා අඩු කිරීමේ ඉලක්කය සැබෑ කරගැනීම සඳහා ශ්‍රී ලංකාව සාර්ථකව කටයුතු කරමින් සිටින බවයි (රූපසටහන 16). මූල්‍ය ක්‍රමෝපායයේ සඳහන් පරිදි, ණය ප්‍රමාණය ඉතා අඩු මෙන්ම දැරිය හැකි මට්ටමට පත් වීමට සහ ප්‍රතිපත්ති නම්‍යශීලීභාවය යථා තත්ත්වයට පත් කිරීමට වසර ගණනාවක් පුරා තිරසාර ලෙස ණය අඩු කිරීම අවශ්‍ය වනු ඇත.

පවතින වැඩසටහනේ කොටසක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසාරභාවය පිළිබඳ විශ්ලේෂණය සිදු කර නිරන්තරයෙන් යාවත්කාලීන කර ඇත. ණය තිරසාරභාවය පිළිබඳ විශ්ලේෂණය (DSA) සිදු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය තම අභ්‍යන්තර ධාරිතාවයන් ද සංවර්ධනය කරමින් සිටින අතර මෙය වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.


ණය අඩු කිරීමේ අරමුණට අමතරව, ණය තිරසාරභාවයට අදාළ ප්‍රධාන ඉලක්කවලින් එකක් වන්නේ වාර්ෂික දළ මූල්‍යයනය අවශ්‍යතාවය (පුළුල් ලෙස, නව ණය ගැනීම් සහ ප්‍රතිමූල්‍යයනය ආවරණය කිරීමට අවශ්‍ය ණය ප්‍රමාණය) කළමනාකරණය කළ හැකි බව සහතික කිරීමයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන යටතේ මෙය 2027-32 කාලය තුළ ද.දේ.නි.යෙන් සියයට 13 ට වඩා අඩු මට්ටමක සාමාන්‍ය අගයක් විය යුතු බවට ශ්‍රී ලංකාව එකඟ වී ඇත. නවතම පුරෝකථන මඟින් පිළිඹිබු වන්නේ ශ්‍රී ලංකාව මෙම ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කරන බවත්, පුරෝකතනය කරන ලද සාමාන්‍යය අගය සියයට 12.7 ක් වන බැවින්, එය ඉලක්කයට වඩා තරමක් අඩු අගයක පවතින බවත් ය. (රූපසටහන 17).

රූපසටහන 16 | රාජ්‍ය ණය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන


රූපසටහන 17 | දළ මූල්‍යයන අවශ්‍යතාවය



මූලාශ්‍රය : ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන

රාජ්‍ය ණය සම්බන්ධ තුන්වන වැඩසටහන් ඉලක්කය වන්නේ ණය කළඹ විදේශ මුදල් අවදානමට නිරාවරණය වීම කළමනාකරණය කිරීමයි. 2027-32 කාලය තුළ කිසිදු වසරක දී විදේශ මුදලින් ඇති ණය සේවාකරණය ද.දේ.නි.යෙන් සියයට 4.5 නොඉක්මවන බව සහතික කිරීම මෙහි අරමුණයි. නවතම පුරෝකථනවලින් නැවතත් පෙන්නුම් කරන්නේ මෙම ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කරන බවයි (රූපසටහන 18).

රූපසටහන 18 | විදේශ ණය සේවාකරණය



මූලාශ්‍රය : ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන

ණය තිරසාරභාවය ළඟා කර ගැනීම සඳහා වන ප්‍රතිසංස්කරණ

රාජ්‍ය ණය කළඹෙහි අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ආයතනික හා ප්‍රතිපත්තිමය මට්ටමේ වෙනස්කම් රාශියක් ක්‍රියාත්මක වෙමින් පවතී. මේවා අතර:

- ආර්ථිකය ස්ථාවර කිරීම සහ අයවැය තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා පුළුල් පරාසයක් පුරා විහිදෙන සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ;
- රාජ්‍ය ණය තිරසාර මට්ටමක් කරා ගෙන ඒමේ අරමුණින්, ණය අඩු කිරීමේ අරමුණුවලට අනුකූලව, සියයට 2.3 ක ප්‍රාථමික ශේෂ ඉලක්කයක් ලබා දීම;
- ණය තිරසාරභාවය සඳහා වන ඉදිරි දැක්මට සැලකිය යුතු ලෙස දායක වී ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා සාර්ථකව නිම කිරීමට ආසන්න වීම;
- 2025 වසර අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වීමට නියමිත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය 2024 වසරේ පිහිටුවීම;
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත සම්මත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පාලනය නවීකරණය කිරීමට කටයුතු කිරීම;
- සංඛ්‍යාත්මක ඉලක්ක සහිත සංශෝධිත මූල්‍ය වගකීම් රාමුවක් ස්ථාපිත කෙරෙන 2026-30 කාල පරිච්ඡේදය ආවරණය වන පළමු මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ප්‍රකාශයට පත් කිරීම;
- 2025-29 කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි පළමු මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය ප්‍රකාශයට පත් කිරීම; සහ
- මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරව වාර්තා කිරීමත් සමඟ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා කාර්තුමය ණය ප්‍රකාශනය ප්‍රකාශයට; ඇතුලත් වේ.

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සඳහා වාර්ෂික යාවත්කාලීන කිරීම් එක් එක් අයවැය සමඟ ප්‍රකාශයට පත් කෙරෙන අතර ණය කළඹ සඳහා වන විවිධ ඉලක්ක සහ මිනුම්වලට සාපේක්ෂව ලබා ඇති ප්‍රගතිය සලකා බලනු ඇත. කාර්තුමය ප්‍රකාශන මඟින් ප්‍රධාන මිනුම්වල නිරන්තර විශ්ලේෂණයක් ලබා දෙනු ලබන අතර මහජනතාවට ලබා ගත හැකි තොරතුරු බෙහෙවින් වැඩි දියුණු කරනු ඇත.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සැකසුම් මඟින් ණය ගැනීමේ අවශ්‍යතාවය සහ කාලීනව ණය ආපසු ගෙවීම් වඩාත් කළමනාකරණය කළ හැකි වන අතර ඒ හේතුවෙන් මනා ණය ශ්‍රේණිගත කිරීමක් මෙන්ම ණය ලබාගැනීමේ පිරිවැය අඩු වීමක් ද සිදු වේ.

විදේශ ව්‍යවහාර මුදල් මත යැපීම සහ විනිමය අනුපාත අස්ථාවරත්ව හා සම්බන්ධ අවදානම් අඩු කිරීමට සහ වාර්ෂික ප්‍රතිමූල්‍යකරණ අවශ්‍යතාවය අඩු කිරීම සඳහා ණය මෙවලම් කල්පිරීමේ කාලය දීර්ඝ කිරීමට රජයේ ණය සමුච්චය ද ක්‍රමයෙන් නැවත සමාලෝචනය කළ යුතු වේ.

භාණ්ඩාගාර ඇපකර


2024 වසර අවසානය වනවිට රජය සතු ව්‍යවසායයන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇපවන ලද ණය ප්‍රමාණයෙහි වටිනාකම දළ වශයෙන් ඇ.ඩො. මිලියන

4,896 ක් පමණ වූ අතර එය පසුගිය වසර තුනෙහි ද.දේ.නි. යේහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යය සියයට 5.36 ක් පමණ විය (රූප සටහන 19). මූල්‍ය ක්‍රමෝපාය යටතේ රජයේ මුළු ණය ප්‍රමාණය අඩු කිරීමේ අරමුණ උදෙසා මෙම සමස්ත රාජ්‍ය ණය ශේෂ අගය ගණනය කරන ලදී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ ණය ප්‍රමාණය අදාළ මූල්‍ය වර්ෂය සහ ඊට පෙරාතුව මූල්‍ය වර්ෂ දෙකෙහි ද.දේ.නි. යෙහි සාමාන්‍ය අගයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 7.5 ක උපරිමයකට සීමා කර ඇත. තවද, නව ඇපකර සඳහා වන ඉල්ලීම් නිසි ලෙස පරීක්ෂා කිරීම සහ ඉල්ලීම් කරන ආයතනවල (සාමාන්‍යයෙන් ව්‍යවස්ථාපිත ආයතන සහ රජය සතු ව්‍යවසායයන්) මූල්‍ය තත්ත්වය සහ ණය ලබාගැනීමට ඇති යෝග්‍යතාව ඇගයීම සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් සකස් කරමින් පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති ඇතැම් ඇපකර හැරුණු කොට, විශාලතම නොපියවූ වාණිජ ඇපකර ප්‍රමාණය මාර්ග සංවර්ධන අධිකාරිය (ඇ.ඩො. මිලියන 1,068), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ඇ.ඩො. මිලියන 747) සහ ශ්‍රීලංකන් ගුවන් සේවා සමාගම (ඇ.ඩො. මිලියන 504) සතු වේ. මෙම නොපියවූ වාණිජ ඇපකර ප්‍රමාණය ඇපකර යටතේ ලබාගත් සමස්ත නොපියවූ ණය ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 80ක් පමණ විය.

රූපසටහන 19 | නොපියවූ භාණ්ඩාගාර ඇපකර



මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය.

2024 වසරේ දී, ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් රු. මිලියන 8,104 ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.03 කට අඩු) ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් නව ඇපකර දෙකක් පිළිවෙලින්, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් නිකුත් කරන ලදී.

2024 වසරේ දී, මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙනුවෙන් රු. මිලියන 2,200 ක සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙනුවෙන් රු. මිලියන 2,400 ක ඇපකර පියවා ඇත.

උප ණය දීම්

යටිතල පහසුකම් සංවර්ධනයට සහ වෙනත් වැඩසටහන් සඳහා සහ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සඳහා සහාය වන සංවර්ධන පාර්ශවකරුවන් විසින් වඩාත් කැමති ආයතනික සැකැස්ම මෙය වන බැවින් රාජ්‍ය ආයතන රාශියක් වෙනුවෙන් ණය ලබා ගැනීමට ශ්‍රී ලංකා රජයට සිදුව ඇත.

2024 වසර අවසානයේ දී ණයදීමේ නොපියවූ ණය කොටස දළ වශයෙන් රු. බිලියන 195 ක් හෙවත් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.7 ක් පමණ විය. මෙයින් විශාලතම ගනුදෙනුව වන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දී ඇති රු. බිලියන 57 ක පමණ ණය මුදලය. ණය කළඹෙන් සියයට 94 ක් පමණ විදේශ ආධාර ව්‍යාපෘති හා වැඩසටහන්වලට සම්බන්ධ වන අතර ඉතිරි සියයට 6 රාජ්‍ය ආයතන වෙනුවෙන් ලබාගත් දේශීය මූලාශ්‍ර මඟින් ලබා ගත් ණය නිරූපණය කරයි.

සාරාංශ ඇගයුම: *සිදුවිය හැකිය, මධ්‍යස්ථ බලපෑමක් ඇති.*	**ශ්‍රේණිගත කිරීම**
ඉදිරි වසර පහ තුළ, විශේෂයෙන්ම විනිමය අනුපාතික සහ පොලී අනුපාතිකවල වලනයන් වැනි ශ්‍රී ලංකාවේ ණය සේවාකරණය කෙරෙහි බලපෑ හැකි අවදානම් තත්ත්ව ඇති වීමේ මධ්‍යස්ථ සම්භාවිතාවක් පවතින බවට සැලකේ. ඇමරිකානු ඩොලරයට එරෙහිව රුපියල අඛණ්ඩව ශක්තිමත් වීම වැනි සමහර වෙළෙඳපොළ ප්‍රවණතාවයන් ශ්‍රී ලංකාවට වාසිදායක විය හැකිය. මෙතෙක් ගෙන ඇති ණය ප්‍රමාණය අඩු කිරීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, රජය සතු ව්‍යවසායයන්ගේ කාර්යසාධනය සහ ලාභදායීතාවය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය ශක්‍යතා ඇගයීම් පාදකව පමණක් භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම වැනි ප්‍රතිපත්තිමය සීමාවන් පැනවීම ආදී පියවර හමුවේ ඇති විය හැකි බලපෑම මධ්‍යස්ථ බවට සැලකේ.	

ඇ. ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම්

ආපදා අවස්ථාවක දී ප්‍රතිචාර ලෙස සම්පත්, පුද්ගලයින් සහ තොරතුරු සංවිධානාත්මකව සැලසුම් කිරීම සහ කළමණාකරණය කිරීම, සහන ලබාදීම සහ නැවත යථා තත්ත්වයට පත් වීම සඳහා පහසුකම් ලබාදීම සහ හානියට පත් රාජ්‍ය දේපල ප්‍රතිසංස්කරණය කිරීම

හෝ පුනරුත්ථාපනය කිරීමේ අනපේක්ෂිත වියදම් හේතුවෙන් ස්වාභාවික ආපදා ආශ්‍රිත මූල්‍ය අංශය සම්බන්ධ අවදානම් ඇති වේ.

අනෙකුත් සැළකිය යුතු වක්‍ර වියදම් අතරට, රජයේ ආදායම් අහිමි වීම, රක්ෂණ ආවරණ ලබා දීම සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු යටිතල පහසුකම් ගොඩනැගීම ඇතුළු අවදානම් කළමනාකරණය සහ අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය අතිරේක වියදම් ආදිය ඇතුළත් වේ.

ආර්ථිකයේ ප්‍රාග්ධන පදනමට හානි වීම සහ විශාල ආපදාවකින් පසු නිෂ්පාදන අහිමි වීම හා ලැබීමට නියමිතව තිබූ ආදායම් අහිමි වීම හරහා ආර්ථිකයට බලපෑම් ඇති විය හැකිය.

ස්වාභාවික ආපදා මූල්‍ය අංශයේ අවදානම් බවට පත් වන්නේ විශාල ආපදා සංසිද්ධියකට මුහුණ දීම සඳහා අයවැය තුළ පවතින ප්‍රතිපාදන සහ අසම්භාව්‍යතා බැරකම් සහ අයවැයෙන් පිටත පවතින ආපදා අවස්ථාවක දී මූල්‍යමය බර රජයෙන් වෙනත් පාර්ශවයකට මාරු කිරීම් (risk transfer) සහ හදිසි අසම්භාව්‍ය මූල්‍යයන ක්‍රමෝපායයන් ප්‍රමාණවත් නොවන විටදී ය.

විශාල ආපදා සංසිද්ධියකට පසු අසම්භාව්‍ය බැරකම් ද වැඩි විය හැකිය (උදා: රජය සතු ව්‍යවසායයන්ට තාවකාලිකව ණය ගෙවීමට නොහැකි වීම හෝ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ ඇති ආදායම් ඇපකරයක් ගෙවීමට සිදු වීම (උදා: ගාස්තු ගෙවා පරිහරණය කරනු ලබන මාර්ගයක් දැඩි ලෙස හානියට පත්වීම ආදිය හේතුවෙන්).

කාලගුණ විපර්යාස හේතුවෙන් ස්වාභාවික ආපදා ඇතිවීමේ ප්‍රවණතාවය සහ ඒවායේ බලපෑම තීව්‍ර වී ඇති අතර, ඒ හේතුවෙන් ස්වාභාවික ආපදා අවදානම් කළමනාකරණය කිරීමේ සහ බලපෑම් අවම කිරීමේ විධිමත් ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම කඩිනමින් සිදු කළ යුතුව ඇත. ආර්ථික වර්ධන විභවතාවය අඩු කරමින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සඳහා දිගුකාලීන බලපෑම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් වඩාත් අහිතකර දේශගුණික විපර්යාස තත්ත්වයන් ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායීතාව කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ හැකිය.

ශ්‍රී ලංකාව ස්වාභාවික ආපදාවලට නිරාවරණය වීම

ශ්‍රී ලංකාව ස්වාභාවික ආපදා උවදුරු රාශියක බලපෑමට ලක් වන අතර ගංවතුර, නායයෑම්, සුළි කුණාටු, නියඟ ආදිය නිතර සිදුවන ප්‍රධාන ආපදා තත්ත්වයන් වේ (රූපසටහන 20).


අහඹු සිදුවීම්වල බලපෑම හේතුවෙන් පමණක් නොව ඒවා බලපාන ප්‍රදේශයේ ජනාකීර්ණත්වය හෝ යටිතල පහසුකම්වලට ඔරොත්තු දීමේ හැකියාව අනුව එක් එක් සිදුවීමෙහි පරිමාණය හා බලපෑම සැලකිය යුතු ලෙස වෙනස් වේ.

නිතර සිදු නොවන නමුත් අතිශයින් හානිදායක (2023 වසරේ වටිනාකමින් ඇ.ඩො. බිලියන 2 කට වඩා) ස්වාභාවික උපද්‍රව අතර, විශාල පිරිසකට ජීවිත සහ තම ජීවනෝපාය අහිමි කරමින් රටේ විශාල ප්‍රදේශයකට ව්‍යසනකාරීව බලපෑ 2004 වසරේ ඉන්දියානු සාගර සුනාමිය ප්‍රධාන වේ.

මෑත වසරවල දී, ප්‍රබල ගංවතුර හා නායයාම් උවදුරු සැලකිය යුතු අභියෝග එල්ල කර ඇත (2016 වසර සහ 2017 වසරේ දී ගංවතුර උවදුරු හේතුවෙන් සමස්ත ආර්ථික අලාභය 2023 වසරේ වටිනාකමින් ඇ.ඩො. බිලියන 2.3 ක් පමණ විය).

නියඟ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ ආදායමට තීව්‍ර සහ අඛණ්ඩ බලපෑම් එල්ල කර ඇත. කිහිපවරක්ම සැලකිය යුතු ලෙස ඩෙංගු උණ රෝගය පැතිරීම සිදු වී ඇත.

රූපසටහන 20 | ස්වාභාවික විපත් සිදුවීම් (උපද්‍රවයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්, අනතුර අනුව, ලඝු පරිමාණය)



මූලාශ්‍රය: ශ්‍රී ලංකාව ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම 2021-2030

ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස සඳහා ඇස්තමේන්තුගත පිරිවැය

ශ්‍රී ලංකාව තුළ මෙතෙක් වාර්තා වූ ස්වාභාවික ආපදා වියදම් පිළිබඳ මධ්‍යගත නිල ඇස්තමේන්තුවක් දැනට නොමැත. කෙසේ වෙතත්, පසුගිය දශකය තුළ සිදු වූ ප්‍රධාන සිදුවීම්වලින් පසු සංවර්ධන පාර්ශවකරුවන් විසින් ඇස්තමේන්තු ගණනාවක් සකස් කර ඇත.

2016 වසරේ දී ලෝක බැංකුව සහ ආපදා අවම කිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ගෝලීය පහසුකම (Global Facility for Disaster Reduction and Recovery) විසින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා හා සම්බන්ධ වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කරන ලදී[3].

[3] ලෝක බැංකුව සහ ආපදා අවම කිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ගෝලීය පහසුකම (Global Facility for Disaster Reduction and Recovery) (2016), "Fiscal Disaster Risk Assessment and Risk Financing Options"

එම වාර්තාව අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.0 කට වඩා වැඩි හානියක් ඇති කළ 2004 වසරේ හටගත් ඉන්දියානු සාගර සුනාමියේ ව්‍යසනකාරී බලපෑම හැරුණු කොට, ස්වාභාවික ආපදා හේතුවෙන් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස වාර්ෂිකව සියයට 1.5 ක ආර්ථික අලාභයක්[4] ඇති වේ.

ස්වාභාවික විපත් ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය පිරිවැය ගණනය කිරීමේ දී මෙම වාර්තාව උපකල්පන කිහිපයක් භාවිතා කරනු ලබන අතර නිවාස හා මහාමාර්ග සඳහා සම්බන්ධීකරණ, සහන සහ යලි ගොඩනැගීම සඳහා පහසුකම් සැපයීමට අදාළ මූල්‍ය පිරිවැය වාර්ෂික සාමාන්‍ය ආර්ථික අලාභයෙන් තුනෙන් එකක් එනම් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.5 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත.

ස්වාභාවික විපත් වඩාත් සුලබ සහ ප්‍රබල වෙමින් පවතින බවට මතයක් පවතී. ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන සාමාන්‍ය ආර්ථික හානිය පිළිබඳ මෑතකදී කරන ලද ඇස්තමේන්තුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.5[5] ක් පමණ වේ.

ඉහත සඳහන් කරන ලද පරිදි ලෝක බැංකුව සහ ආපදා අවම කිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ගෝලීය පහසුකම ඉදිරිපත් කර ඇති උපකල්පන අනුව, මෙම අගය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.9 ක අපේක්ෂිත වාර්ෂික රාජ්‍ය මූල්‍ය පිරිවැයක් වනු ඇත.

විකල්ප දේශගුණික විපර්යාස අවස්ථා යටතේ, ස්වාභාවික ආපදා හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදුවන වාර්ෂික ඇස්තමේන්තුගත ආර්ථික අලාභය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.5 ක සිට සියයට 2.8-3.0 දක්වා ඉහළ යනු ඇති අතර; ඉහත උපකල්පන මත වාර්ෂික රාජ්‍ය මූල්‍ය පිරිවැය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.1 ක් වේ.

ශ්‍රී ලංකාවට වාර්ෂිකව ඇ.ඩො. මිලියන 430 ක් එනම් ද.දේ.නි. යෙන් සියයට 0.5[6] ක් දේශගුණික වෙනස්වීම් සඳහා අනුවර්තනය වීමේ පිරිවැය ලෙස දැරීමට සිදු වේ.

ස්වාභාවික ආපදා හේතුවෙන් ඇතිවන මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම

රාජ්‍ය මූල්‍ය අවදානම් ප්‍රභවයක් ලෙස ස්වාභාවික ආපදාවන්ගේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සංවර්ධන පාර්ශවකරුවන්ගේ සහාය ද ඇතිව රජය පහත සඳහන් ප්‍රතිසංස්කරණ සහ සමාලෝචන ක්‍රියාවලියන් ඉදිරියට සිදු කරනු ඇත. මෙමඟින්, අනාගතයේ දී ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන රාජ්‍ය මූල්‍ය අවදානම තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් පදනමක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව, ස්වාභාවික ආපදා හේතුවෙන් වැයවන සැබෑ වියදම් හඳුනාගැනීම සඳහා දත්ත පද්ධති සහ මූල්‍ය වාර්තා වැඩිදියුණු කිරීම සහ අවදානම් ඇගයීම සහ පුරෝකථන මෙවලම් යාවත්කාලීන කිරීම;


- අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම්, අසම්භාව්‍යතා සහ සංචිතවල ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ ස්වාභාවික විපත්, මූල්‍ය ක්‍රමෝපාය වියදම් සීමාව තුල කළමනාකරණය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක සැලසුම් සංවර්ධනය කිරීම;

- අදාළ රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ වෙළඳපොළවල් සහ අසම්භාව්‍ය මූල්‍යකරණ මෙවලම්වල ස්වභාවය, ශක්‍යතාව සහ දැරිය හැකි බව සමාලෝචනය කිරීම;

- මූල්‍ය අංශය සහ රජය, ස්වභාවික විපත් සඳහා මුහුණ දීමට සමස්තයක් ලෙස ඇති හැකියාව සලකා බැලීම; සහ

- විකල්ප දේශගුණික විපර්යාස තත්ත්වයන් මත පදනම්ව අපේක්ෂිත ආර්ථික හා රාජ්‍ය මූල්‍ය බලපෑම් විශ්ලේෂණය කිරීම සහ පුරෝකථනය කිරීම.

ඉදිරියේ දී නිකුත් කෙරෙන මූල්‍ය අවදානම් ප්‍රකාශන

සාරාංශ ඇගයුම: බොහෝ විට සිදුවිය හැකි, මධ්‍යස්ථ බලපෑමක් ඇති විය හැක. ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන සැලසුම් කාලසීමාව තුල ගංවතුර, නායයෑම් සහ නියඟය වැනි ස්වාභාවික විපත් මඟින් දැඩි බලපෑම් ඇති වීමේ ඉහළ අවස්ථාවක් ඇත. සිදුවීම්වල බරපතලකම පුරෝකථනය කිරීම දුෂ්කර වුවද, පෙර අත්දැකීම් අනුව අනපේක්ෂිත මූල්‍ය පිරිවැය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.25 සිට 0.75 දක්වා පරාසයක් තුළ පැවතිය හැකි අතර වඩාත් අධික පිරිවැයක් ඇති විය හැකි සිදුවීම් ද සිදුවිය හැක. ණය බර අඩු කිරීම සැලසුම් කල පරිදි සිදු වෙමින් පවතින බව සහතික කිරීම, වාර්ෂික ප්‍රතිපාදන, අසම්භාව්‍යතා සහ රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ආවරණ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම අවදානම් කළමනාකරණ පියවර අතරට ඇතුළත් වේ.	**ශ්‍රේණිගත කිරීම** 

[4] ස්වාභාවික විපත් සිදු වන පසුබිමක් තුළ ආර්ථික අලාභය යනු ප්‍රාග්ධන වත්කම්වලට සිදුවන හානියේ වටිනාකම සහ තුවාල හා ජීවිත හානි ඇතුළුව අහිමි වන සමස්ත නිමැවුම් හා ආදායම් වටිනාකම බවට නිර්වචනය කර ඇත. මෙම පසුබිම තුළ ස්වාභාවික විපත් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඇතිවන බලපෑම නොසැළකේ.

[5] එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිපික් ආර්ථික හා සමාජ කොමිසම, අවදානම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ අන්තර්ජාල ප්‍රවේශ ද්වාරය, ශ්‍රී ලංකාව පිළිබඳ දළ විශ්ලේෂණය.

[6] එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිපික් ආර්ථික හා සමාජ කොමිසම, අවදානම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ අන්තර්ජාල ප්‍රවේශ ද්වාරය, ශ්‍රී ලංකාව පිළිබඳ දළ විශ්ලේෂණය.

ඉ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම්

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ට අදාළ නීතිමය ගිවිසුම් මඟින් රජයට හෝ රාජ්‍ය ආයතනවලට අසම්භාව්‍ය බැරකම් (contingent liabilities) ඇති කරන විට මූල්‍ය අවදානම් ඇති වේ. ආදායම් හා ණය ඇපකර මඟින් මෙන්ම වාණිජ ආරවුල් හෝ ප්‍රතිපත්ති වෙනස්වීම්වලට අදාළව වන්දි ගෙවීම් සඳහා නීතිමය හිමිකම් පැවතීම මඟින් ද මෙවැනි අසම්භාව්‍ය බැරකම් පැන නැඟිය හැක.

ශ්‍රී ලංකාවේ මෑත කාලීන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

යටිතල පහසුකම් සංවර්ධනය සහ සේවා සැපයීම් වැඩිදියුණු කිරීමට පෞද්ගලික ආයෝජන වැඩි වශයෙන් යොදවා ගැනීම සඳහා ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය තුළ විශේෂයෙන්ම ප්‍රවාහනය, බලශක්තිය සහ නාගරික සංවර්ධනය වැනි අංශවල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් කිහිපයක් ආරම්භ කරන ලදී. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හඳුන්වා දී ඇති ප්‍රධාන අංශ කිහිපයක් නම්:

විදුලිබල හා බලශක්ති: ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (AEB) විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව බලශක්ති ව්‍යාපෘති බොහෝමයක් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති අතරට කෙරවලපිටියේ මෙගාවොට් 350 ක ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාර දෙකක් ඇතුළත් වන අතර, බලාගාර දෙකෙහිම බදු සහ යටිතල පහසුකම් වෙනස්කම් හේතුවෙන් අදාළ ගිවිසුම් නැවත සාකච්ඡා කරන ලද අතර, ඒ අනුව ඒවායේ පිරිවැය ඇ.ඩො. මිලියන 37.83 ක් සහ ඇ.ඩො. මිලියන 35.56 ක් බැගින් වැඩිවිය. ත්‍රිකුණාමලයේ මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියකට ස්වෛරීත්ව ඇපකරයක් ඇතුලත් වන අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ කොටස් දායකත්වයෙන් සියයට 50 ක් (ඇ.ඩො. මිලියන 12.5) තවමත් ගෙවීමට ඉතිරිව පවතී.

අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘති අතරට පුනරින් හි (Pooneryn) මෙගාවොට් 700 ක සූර්ය බලාගාරය, තම්බපවනී (Thambapavani) මෙගාවොට් 50 ක සුළං ව්‍යාපෘතිය සහ සියඹලාණ්ඩුව සහ හම්බන්තොට ප්‍රදේශවල විශාල සූර්ය උද්‍යාන ඇතුලත් වේ. බොහෝ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන්නේ පෞද්ගලික ආයෝජකයින් විසින් වන අතර රජයේ ඇපකර ද මේ වනතෙක් භාවිතා කිරීමක් සිදුවී නොමැත.

ජල සම්පාදන හා ජලාපවහනය: රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව රාමුව යටතේ 2025 වසරේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මහා පරිමාණ ආදායම් නොලබන ජලය (NRW) භාවිතය අඩු කිරීමේ ව්‍යාපෘතියක් ගාල්ල ප්‍රදේශයේ ආරම්භ කිරීමට නියමිතව ඇති අතර එය දැනට වසර 8 ක කාලයක් සඳහා සැලසුම් කර ඇත. වර්තමානයේ ආරම්භක අදියරේ පසුවන මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු. මිලියන 3,337 ක් වන අතර මෙහි අරමුණ වන්නේ, පුද්ගලික අංශයේ සහයෝගීතාවය හරහා ජලය අපතේ යාම අවම කිරීම තුලින් ජලය සැපයීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම වේ.

වරාය සංවර්ධනය: ඇ.ඩො. මිලියන 700 ක ව්‍යාපෘතියක් වන බටහිර බහාලුම් පර්යන්තය-I (WCT-I) 2022 වසරේ පෙබරවාරි මස ආරම්භ වී 2027 වසරේ පෙබරවාරි මස දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය. ඇ.ඩො. මිලියන 200 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය දැනට ප්‍රසම්පාදන අදියරේ පවතින අතර, 2024 වසරේ මැයි මාසයේ දී අභිලාෂ කැඳවීමේ ලිපි හතක් ලැබුණු අතර, ඉන් ලිපි හයක් තෝරාගෙන ඇති අතර ව්‍යාපෘති යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ඉදිරිපත් කිරීම සඳහා වන අවසාන දිනය 2025 වසරේ ජුනි මස 12 වන දින වේ. ඇ.ඩො. මිලියන 150 ක ව්‍යාපෘතියක් වන දකුණු ආසියා වාණිජ හා සේවා සැපයුම් කේන්ද්‍රස්ථාන ව්‍යාපෘතිය මේ වන විට ප්‍රදානය කර ඇති අතර එය මාස 42 ක් තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම කටයුතු මඟින් පුද්ගලික අංශය සමඟ එළඹෙන උපායමාර්ගික හවුල්කාරිත්වයන් හරහා ශ්‍රී ලංකාවේ වරාය යටිතල පහසුකම් නඟා සිටුවීම අරමුණු කෙරේ.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ගෙන් පැන නඟින මූල්‍ය අවදානම් විශ්ලේෂණය

වර්තමානයේ දී ශ්‍රී ලංකාවට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති පිළිබඳ නිල ලේඛනයක් හෝ ඒවායේ කාර්යසාධනය සහ අවදානම් නිරීක්ෂණය කිරීමට කිසිදු සම්බන්ධීකරණ ආයතනයක් නොමැත. මෙම දුර්වලතාවය සඳහා විසඳුමක් ලෙස 2026 අයවැය මඟින් සම්පූර්ණ ව්‍යාපෘති ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

විශේෂයෙන්ම අතීතයේ දී නිසි ලෙස සැලසුම් නොකළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සහ විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව කරනු ලැබූ යෝජනා (unsolicited proposals) හරහා රජයට අසම්භාව්‍ය බැරකම් ඇතිවී දිගුකාලීන මූල්‍ය වගකීම් ඇති වූ බැවින් රජය, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇති විය හැකි මූල්‍ය අවදානම් පිළිබඳව අවධානයෙන් සිටී.

කලාපීය රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාව රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව වෙත යොමු වීම අඩුවෙන් සිදු වුව ද, ශක්තිමත් නෛතික සහ ආයතනික රාමුවක් නොමැතිකම හේතුවෙන් මීට පෙර අවදානම් ඇගයීම නිසි පරිදි අඛණ්ඩව සිදු කිරීමට නොහැකි විය.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු සංවර්ධන

පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා වඩා සවිස්තරාත්මක හා පුළුල් මූල්‍ය අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීමට පියවර ගනිමින් සිටී. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පිළිබඳ නීතියක් කෙටුම්පත් කර ඇති අතර, මුදල් අමාත්‍යාංශය තුළ මධ්‍යගත රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ඒකකයක් ස්ථාපිත කරමින් සිටියි.

මේ වන විට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආශ්‍රිත අවදානම්, එනම් ඇපකර, අවම ආදායම් බැඳීම් (minimum revenue commitments) සහ අනෙකුත් ආකාරයේ අසම්භාව්‍ය බැරකම් වඩාත් ක්‍රමානුකූලව සමාලෝචනය කරමින් පවතින නමුත්, මෙම විශ්ලේෂණයන්ගේ පුළුල්බව හා එම විශ්ලේෂණ සිදු කරන වාර ගණන වැඩි කළ යුතුය.

අවදානම් අඩු කිරීමේ උපායමාර්ග

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව මඟින් ඇතිවන මූල්‍ය අවදානම් අවම කිරීම සඳහා ආයතනික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ බොහෝමයක් ක්‍රියාත්මක වෙමින් පවතී.


මෙහිදී මුදලට සරිලන වටිනාකම (value for money) විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමිතිගත මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම, අවදානමේ බලපෑම සහ එම අවදානම සිදුවීමට ඇති සම්භාවිතාවය පැහැදිලි කරන අනුකෘති (risk allocation matrices) භාවිතය සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස මූල්‍ය බලපෑම් තක්සේරු කිරීම් අනිවාර්ය කිරීම ඇතුළත් වේ.

අවදානම් අවම කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන මෙවලමක් ලෙස අසම්භාව්‍ය බැරකම් ලේඛනයක් ස්ථාපිත කිරීම දැක්විය හැකි අතර, එයට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව සම්බන්ධ ඕනෑම බැඳීමක් ඇතුළත් කළ හැක. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින්, අසම්භාව්‍ය බැරකම් පිළිබඳ වඩාත් පැහැදිලි තොරතුරු හෙළිදරව් කිරීමක් අනිවාර්ය කර ඇති අතර, මෙය අවදානම් පිළිබඳව පැහැදිලිව නිරීක්ෂණය කිරීමට සහ ඒවා නිවැරදිව කළමනාකරණය කිරීමට උපකාරී වේ. එපමණක් නොව, නව රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව කොන්ත්‍රාත්තුවල අවදානම් බෙදාගැනීම පිළිබඳ විධිවිධාන සැකසීමේ දී ඇපකර සහ ස්වශක්තාව ඉහළ නැංවීම සඳහා සහන ලෙස ලබාදෙන මූල්‍ය සහයෝගයන් සඳහා උපරිම සීමාවන් පැහැදිලිව ඇතුළත් කර ඇත. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති ව්‍යුහගත කිරීම සහ ගිවිසුම් කළමනාකරණය සඳහා අවශ්‍ය දැනුම හා හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බහුපාර්ශ්වික පාර්ශවකරුවන්ගේ තාක්ෂණික සහාය ලබා ගැනේ.

ඉහත සියළු පියවරවල අරමුණ වන්නේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති රජයට දිගු කාලීන මූල්‍ය ගැටළු ඇති කිරීමකින් තොරව, මහජනතාවට ප්‍රයෝජනවත් වන අයුරින් නිවැරදි ආකාරයෙන් භාවිතා කරන බව සහතික කිරීමයි. ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිත රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පනත් කෙටුම්පත මඟින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා ජාතික ආයතනයක් පිහිටුවීමට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමට සහ ඒවා සඳහා පහසුකම් සැලසීමට අදහස් කරන අතර, ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කරුණු සියල්ල ආමන්ත්‍රණය කිරීමට ද අදහස් කෙරේ.

මෙම පනත් කෙටුම්පත මඟින් විනිවිදභාවය, තරහකාරිත්වය, රාජ්‍ය මූල්‍ය වගකීම සහ පාරිසරික හා සමාජීය ප්‍රමිතීන්ට අනුකූල වීම අවධාරණය කරන අතරම රාජ්‍ය අංශයේ දැනුම හුවමාරුව සහ ධාරිතා සංවර්ධනය දිරිමත් කරයි. මෙම පනත් කෙටුම්පත මඟින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ට අදාළ නීති හා රීති මෙන්ම වගකිවයුතු ආයතන පිළිබඳව පැහැදිළිව දැක්වීම අරමුණු කරන අතර, එමඟින් ආයෝජක විශ්වාසය වැඩිදියුණු කිරීමටත් සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ගේ පාලනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස සැකසීමටත් අරමුණු කෙරේ.

ශ්‍රේණිගත කිරීම



සාරාංශ ඇගයුම: සිදුවිය හැකි, මධ්‍යස්ථ බලපෑමක් සහිත.

ශ්‍රී ලංකාවේ ජාතික යටිතල පහසුකම් ව්‍යාපෘතිවලින් සාපේක්ෂව කුඩා ප්‍රතිශතයක් සඳහා පමණක් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව දායක වන නමුත්, පසුගිය දශකය තුළ මෙම ප්‍රභවයෙන් පැන නැඟුණු සැලකියයුතු මූල්‍ය අවදානම් ඇති අවස්ථා දක්නට ලැබුණි. එත්මන් අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමවේදය තුළ ද නිවැරදි කළ යුතු දුර්වලතා කිහිපයක්ම තිබේ. මූලික ඇගයීමක් ලෙස, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව කොන්ත්‍රාත්තු යටතේ අසම්භාව්‍ය බැරකම් සඳහා ගෙවීමට සිදුවීම මඟින් ඇතිවිය හැකි බලපෑම සාපේක්ෂව අඩු යැයි සැලකිය හැක. අවදානම් කළමනාකරණය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අතරට, ජාතික නීති රාමුවක් ස්ථාපිත කිරීම සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සහ නව ව්‍යාපෘති සියල්ලෙහිම අවදානම් විශ්ලේෂණය සහ අධීක්ෂණය නිසි පරිදි සිදුකිරීම සහතික කිරීම සඳහා සම්බන්ධීකරණ ආයතනයක් ස්ථාපිත කිරීම ඇතුළත් වේ.

මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සඳහා අවශ්‍ය අන්තර්ගතයන්

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව (PFMA) මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි (FSS) ඇතුළත් විය යුතු අවම අන්තර්ගතයන් නියම කරන අතර එයට ඇතුළත් වනුයේ:

I. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ එම ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති;

II. රාජ්‍ය ණය තිරසාර මට්ටමකට අඩු කිරීම සඳහා යෝජිත කාල රාමුව;

III. වගකිවයුතු මූල්‍ය කළමනාකරණය තහවුරු කිරීම සඳහා රජයේ උපායමාර්ගික ප්‍රමුඛතා;

IV. රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ ප්‍රතිපත්ති වගකිවයුතු මූල්‍ය කළමනාකරණයේ අරමුණු සමඟ අනුකූල වන ආකාරය පැහැදිලි කිරීම;

V. මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව;

VI. මූල්‍ය ක්‍රමෝපායයට සාපේක්ෂව කාර්ය සාධනය තක්සේරු කිරීමට, ඇතුළත් වනුයේ,

- පෙර මූල්‍ය වර්ෂයේ දී මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වීම පිළිබඳ තක්සේරුවක් ද , එම ඉලක්ක සමඟ අනුකූල නොවීම පිළිබඳ පැහැදිලි කිරීමක් ;
- වත්මන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය පිළිබඳ තක්සේරුවක්;
- ඉදිරි මූල්‍ය වර්ෂය සහ ඊළඟ වසර හතර සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අපේක්ෂිත අනුකූලතාවය පිළිබඳ තක්සේරුවක්; සහ
- වත්මන් මූල්‍ය වර්ෂය සහ ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල නොවීමේ අවදානම් පිළිබඳ තක්සේරුවක්;

VII. වගකීම් සහගත මූල්‍ය කළමනාකරණයේ පවතින අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධා වන ප්‍රධානතම මූල්‍ය අවදානම් මූලාශ්‍ර; සහ

VIII. පසුගිය වසර තුන ඇතුළත ගනු ලැබූ මූල්‍ය තීරණවල සාර්ව ආර්ථික බලපෑමයි.

මූල්‍ය තිරසාරභාවයට සහාය වීම සඳහා ගනු ලැබූ නිශ්චිත ප්‍රතිපත්තිමය පියවර

1. මූල්‍ය විනය සඳහා නව නීතිමය ආකෘතියක්
   - 2024 වසරේ ජුනි මාසයේ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත (PDMA) බලාත්මක කිරීම.
   - 2024 වසරේ අගෝස්තු මාසයේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFMA) බලාත්මක කිරීම.
   - 2024 වසරේ දෙසැම්බර් මස 02 වන දින රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම.
   - බදු වියදම් ප්‍රකාශය ප්‍රකාශයට පත් කිරීම.

2. ප්‍රධාන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ: බදු පදනම පුළුල් කිරීම, අනුපාත දර්ශකගත කිරීම

   2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;
   - සම්මත එකතු කළ අගය මත බදු (VAT) අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම.
   - ප්‍රධාන අයිතම සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් බහුතරයක් ඉවත් කිරීම.
   - එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
   - සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම.
   - උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකය මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදුවලට යටත් සියලුම භාණ්ඩවල නිෂ්පාදන බද්ද සියයට 14 කින් සංශෝධනය කිරීම.
   - වාර්ෂික උද්ධමනය අනුව සකස් කරන ලද දර්ශකයක් මත පදනම්ව සියලුම මත්පැන් වර්ග සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම.

   2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;
   - වාර්ෂික උද්ධමනය මත පදනම්ව දර්ශකකරණය අනුව ඒකක අනුපාත නිෂ්පාදන බදු සහිත සියලුම භාණ්ඩ සඳහා නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
   - වාර්ෂික උද්ධමනය මත පදනම්ව දර්ශකකරණය අනුව, සියලුම මත්පැන් වර්ග සඳහා සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.

   2025 වසරේදී අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි;
   - පුද්ගලයෙකු සඳහා අදාළ වන පුද්ගල ආදායම් බදු සහනය වාර්ෂිකව රු. 1,200,000/- සිට රු. 1,800,000/- දක්වා වැඩි කිරීම සහ පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායමට අදාළ වන බදු අනුපාත සංශෝධනය කිරීම.

පුද්ගල ආදායම් බදු (PIT) ව්‍යුහයේ සංශෝධන

	වාර්ෂික බදු අය කළ හැකි ආදායම (රු.)	
ආන්තික බදු අනුපාතය %	පෙර අනුපාත	වත්මන් අනුපාත
0	මිලියන 1.2 දක්වා	මිලියන 1.8 දක්වා
6	මිලියන 1.2 - 1.7	මිලියන 1.8 - 2.8
12	මිලියන 1.7 - 2.2	-
18	මිලියන 2.2 - 2.7	මිලියන 2.8 - 3.3
24	මිලියන 2.7 - 3.2	මිලියන 3.3 - 3.8
30	මිලියන 3.2 - 3.7	මිලියන 3.8 - 4.3
36	මිලියන 3.7 ට වැඩි	මිලියන 4.3 ට වැඩි

3. බදු පරිපාලනය සහ ආයතනික ව්‍යුහය නවීකරණය කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

- අපරාධ විමර්ශන ඒකකය පිහිටුවීම.
- රැකියා සහ පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින් සඳහා 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සරල කළ පුද්ගල ආදායම් බදු වාර්තා යොමු කිරීමේ පෝරමයක් හඳුන්වා දීම.
- අවදානම් කළමනාකරණ ඒකකය පුළුල් කිරීම.
- 2025 වසරේ ඔක්තෝම්බර් මස සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමය අහෝසි කිරීමෙන් පසු අපනයනකරුවන් සඳහා එකතුකළ අගය මත බදු ආපසු ගෙවීම් කඩිනම් කිරීම සඳහා අපනයනකරුවන් සඳහා මුදල් ආපසු ගෙවීමේ ඒකකයක් ආරම්භ කිරීම.
- අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම.

ශ්‍රී ලංකා රේගුව

- 2024–2028 වර්ෂයන් සඳහා උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම.
- අභ්‍යන්තර කටයුතු ඒකකයක් ස්ථාපිත කිරීම.
- සතිපතා ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලකුණු කාඩ්පත් සමඟ "දින 80 විශිෂ්ඨතා" වැඩසටහන දියත් කිරීම.
- අවදානම් නීති සහ බහාලුම් පරීක්ෂා සාර්ථකත්ව අනුපාතය ප්‍රතිසංස්කරණය කිරීම.
- ASYHUB පද්ධතිය ක්‍රියාත්මක කිරීම.

සුරාබදු දෙපාර්තමේන්තුව

- සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.
- රට පුරා බලපත්‍රලාභී සුරාබදු පරිශ්‍රවල අධීක්ෂණය වැඩි දියුණු කිරීම.
- දින 100 විශේෂ බලාත්මක කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. (2024.05.20 සිට 2024.08.27 දක්වා).
- පැය 24 පුරා ක්‍රියාත්මක 1913 ක්ෂණික ඇමතුම් අංකය දියත් කිරීම.
- මධ්‍යසාර පාන වර්ග සඳහා දැඩි තත්ත්ව පාලනයන් පවත්වා ගැනීම සඳහා මධ්‍යම රසායනාගාරයක් ස්ථාපිත කිරීම.
- සුරාබදු ආදායම් එකතු කිරීම හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.
- මූල්‍ය බුද්ධි ඒකකයක් (FIU) ස්ථාපිත කිරීම.
- ආරක්ෂිත ලේබල් කිරීමේ පද්ධතියක් හරහා නීත්‍යානුකූලව නිෂ්පාදනය කරන ලද මධ්‍යසාර පාන වර්ග හඳුනා ගැනීම සඳහා නිර්මාණය කර ඇති නව ජංගම යෙදුමක් හඳුන්වාදීම.